සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP
21 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Second Term Test - Grade 13 - 2018

විභාග අංකය ..... ආර්ථික විද්‍යාව I කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා පිලිතුරට හිමි අංකය මෙම පත්‍රයේම තිත් ඉරිමත ලියන්න.**

01. සෑම සමාජයක්ම තෝරාගැනීමේ ප්‍රශ්නයකට මුහුණ දෙනු ලබන්නේ,
1. සමාජය සතු සම්පත් කාර්යක්ෂමව උපයෝජනය නොකරන බැවිනි.
2. පවත්නා සම්පත් මිනිස් වුවමනා සපුරා ගැනීමට ප්‍රමාණවත් නොවන බැවිනි.
3. නිරන්තරව වර්ධනය වන අසීමිත වුවමනාවන් පවතින බැවිනි.
4. සම්පත් හිඟකම හා සම්පත් විකල්ප අයුරින් භාවිත කළ හැකි බැවිනි.
5. හිඟ සම්පත් භාවිතයට ගැනීමේදී ආවස්ථික පිරිවැයක් හටගන්නා බැවිනි. (.....)

02. කිසියම් කටයුත්තක ආවස්ථික පිරිවැය ලෙස සලකා බලන්නේ,
1. එම කටයුත්ත නිසා අත් හැරීමට සිදු වූ අහිමි වූ ආදායම් වල වටිනාකමයි.
2. එම කටයුත්ත සඳහා වැය වූ සෘජු හා වක්‍ර පිරිවැය දෙකෙහි වටිනාකමයි.
3. එම කටයුත්ත සඳහා දැරීමට සිදු වූ ස්ථාවර හා විචල්‍ය පිරිවැය දෙකෙහි වටිනාකමයි.
4. එම කටයුත්ත සඳහා භාවිත කරන ලද තමන් සතු සම්පත් වල වටිනාකමයි.
5. එම කටයුත්ත වෙනුවෙන් දරන ලද මූල්‍ය පිරිවැයයි. (.....)

03. සේවා වියුක්ති තත්ත්වයක් යටතේ කටයුතු කරන කිසියම් ආර්ථිකයක වර්තමාන ප්‍රාග්ධන ආයෝජනය ඉහළ නංවනු ලැබුවහොත්,
1. වර්තමාන පරිභෝජන මට්ටම පහළ වැටේ.
2. අනාගත ජීවන තත්ත්වය අඩු වනු ඇත.
3. ආවස්ථික පිරිවැයක් හට නොගනී.
4. ප්‍රාග්ධන ආයෝජනයේ ආවස්ථික පිරිවැය වැඩිවේ.
5. පොලී අනුපාතිකය ඉහළ යයි. (.....)

04. මානව සම්පත තුළ සිදුකරන අයෝජනය ඉහළ නැංවීම ආර්ථිකයකට වඩාත් වැදගත් වන්නේ,
1. දැනුම් ආර්ථිකයක් කරා යොමුවිය හැකි බැවිනි.
2. ශ්‍රම ඵලදායිතාව ඉහළ නංවා ගත හැකි බැවිනි.
3. අධ්‍යාපන මට්ටම වර්ධනය කරගත හැකි බැවිනි.
4. ශ්‍රම සූක්ෂම නිෂ්පාදන ශිල්ප ක්‍රමය නිෂ්පාදනය සඳහා බහුලව භාවිත කළ හැකි බැවිනි.
5. ප්‍රාග්ධන උපකරණ භාවිතය වර්ධනය කරගත හැකි බැවිනි. (.....)

05. A - ආණ්ඩුවේ මැදිහත් වීම ඉතා පහළ මට්ටමක පවතී.
B - පෞද්ගලික දේපොළ ක්‍රමය
C - සැලසුම් අධිකාරීන් විසින් වැටුප් හා මිල තීරණය කරයි.
D - සාපේක්ෂ මිල පදනම් කරගනිමින් සම්පත් බෙදා වෙන් කරයි.
E - සාධාරණ ලෙස භාණ්ඩ බෙදා හැරීම තහවුරු කරයි.

ඉහත ලක්ෂණ අතුරින් වෙළෙඳපොල ආර්ථික පද්ධතියක දැකිය හැකි ලක්ෂණ වලින් සමන්විත වන්නේ,
1. A,B හා D ය. 2. A,B හා C ය. 3. B,D හා E ය.
4. A,D හා E ය. 5. A,C හා E ය. (.....)

06. ධනේෂ්වර ආර්ථිකයක්, සාධක වෙළෙඳපොළේ සාධක සඳහා පවතින මිල හා එම මිලට හුවමාරු වන ප්‍රමාණය මත,
1. පවත්නා සම්පත් විවිධ භාවිතයන් අතර බෙදා වෙන් කරයි.
2. නිෂ්පාදන තාක්ෂණය තෝරා ගනියි.
3. පාරිභෝගික වරණය වෙනස්වීම පිළිබඳ සංඥාවක් ලබාදෙයි.
4. කා සඳහා නිෂ්පාදනය කළ යුතුද යන ප්‍රශ්නයට විසඳුම් ලබාදෙයි.
5. කුමක්, කොපමණ නිෂ්පාදනය කළ යුතුද යන්න තීරණය කරයි. (.....)

07. සහල් වෙළෙඳපොළ පිළිබඳව සිදුකරන පාරිභෝගික සමීක්ෂණයකදී අනාවරණය කරගත හැකි කරුණු අනුව, සහල් ඉල්ලුම් ප්‍රමාණයේ අඩු වීමක් හා සහල් සැපයුම් ප්‍රමාණයේ වැඩිවීමක් හටගෙන ඇත. මේ සඳහා හේතුවිය හැකි සාධකය කුමක්ද?
1. සහල්වල අනාගත අපේක්ෂිත මිල පහළ යාමය.
2. සහල් මිල පහළ යාමය
3. සහල් සැපයුම් කරුවන්ගේ සංඛ්‍යාව වැඩි වීමය.
4. සහල් පාරිභෝගිකයන්ගේ ආදායමේ අඩුවීමය.
5. සහල් මිල ඉහළ යාමය. (.....)

08. කිසියම් භාණ්ඩයක් සඳහා මිල ඉල්ලුම් නම්‍යතාව - 0.75 ක් වේ. භාණ්ඩයේ මිල රු. 50 දී අලෙවි ආදායම රු. 4000 කි. මිල රු. 40 දක්වා අඩු වුවහොත් අලෙවි ආදායම කොපමණ වේද?
1. රු. 800 කි. 2. රු. 3680 කි. 3. රු. 3500 කි. 4. රු. 3200 කි. 5. රු. 4500 කි. (.....)

09. බෝතල් කරන ලද පානීය ජලය සඳහා පැවති වෙළෙඳපොළ මිල පහළ යාම නිසා පාරිභෝගික පැහැදම ඉහළ නගින්නේ ඇයි?
1. මෙම භාණ්ඩයේ මිල පහළ යන විට ඉල්ලුම් ප්‍රමාණය වැඩිවීම නිසාය.
2. මෙම භාණ්ඩය සඳහා සමීප ආදේශක නොමැතිවීම නිසාය.
3. මෙම භාණ්ඩය සාමාන්‍ය භාණ්ඩයක් වීම නිසාය.
4. මෙම භාණ්ඩයට ඇති මිල ඉල්ලුම් නම්‍යතාව නම්‍ය වීම නිසාය.
5. මෙම භාණ්ඩය අත්‍යාවශ්‍ය භාණ්ඩයක් වීම නිසාය. (.....)

10. X භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාව - 2.8 කි. X භාණ්ඩයේ ආදායම් ඉල්ලුම් නම්‍යතාව- 1.2 ක් විය. මෙම තොරතුරු වලට අනුව X භාණ්ඩය,
1. බාල භාණ්ඩයකි.
2. ගිෆන් භාණ්ඩයකි.
3. සුඛෝපභෝගී භාණ්ඩයකි.
4. සාමාන්‍ය භාණ්ඩයකි
5. අත්‍යාවශ්‍ය භාණ්ඩයකි. (.....)

11. $Qs = -20 + 2P$ යන සැපයුම් සමීකරණයෙන් දැක්වෙන්නේ කිසියම් භාණ්ඩයක් සඳහා පවතින වෙළෙඳපොළ සැපයුම් වක්‍රයයි. මෙම භාණ්ඩයේ සැපයුම් නම්‍යතාව පිළිබඳව, දී ඇති ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශයේ කුමක්ද?
1. සැපයුමේ මිල නම්‍යතාව අනම්‍ය වේ. වක්‍රයමත ඉහළට යනවිට එහි අගය වැඩිවේ.
2. සැපයුමේ මිල නම්‍යතාව අනම්‍ය වන අතර, වක්‍රය මත ඉහළට ගමන් කරන විට එහි අගය අඩුවේ.
3. සැපයුමේ මිල නම්‍යතාව නම්‍ය වන අතර, වක්‍රය මත ඉහළට යන විට අගය අඩු වේ.
4. සැපයුමේ මිල නම්‍යතාව නම්‍ය වන අතර, වක්‍රය ඉහළට ගමන් කරන විට නම්‍යතා අගය වැඩිවේ.
5. සැපයුමේ මිල නම්‍යතාව ඒකීය වන අතර, වක්‍රය ඉහළට යන විට එහි අගය ස්ථාවරව පවතී. (.....)

12. වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය නම්‍ය වේ නම් සමතුලිතයේ දී හටගන්නා ආර්ථික අතිරික්තය, පාරිභෝගික අතිරික්තයෙන් පමණක් සමන්විත වන්නේ සැපයුම් වක්‍රයේ නම්‍යතාව,
1. නම්‍ය වන විටය.
2. පූර්ණ නම්‍ය වන විටය
3. ඒකීය නම්‍ය වන විටය.
4. අනම්‍ය වන විටය.
5. ශූන්‍ය වන විටය. (.....)

13. නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් ලේඛන පහත පරිදි වේ.

ඒකකයක මිල (රු.)	ඉල්ලුම් ප්‍රමාණය (ඒකක)	සැපයුම් ප්‍රමාණය (ඒකක)
90	400	1000
80	500	900
70	600	800
60	700	700
50	800	600

මෙම භාණ්ඩයේ ඒකකයක් මත රු. 20 ක බද්දක් නිෂ්පාදකයාගෙන් අය කිරීමට රජය තීරණය කරනු ලැබුවහොත් බද්දෙන් පසු වෙළෙඳපොළ මිල හා ආණ්ඩුවේ බදු අයභාරය කොපමණද?

	බද්දෙන් පසු වෙළෙඳපොළ මිල (රු.)	ආණ්ඩුවේ බදු අයභාරය (රු.)
1.	70	6000
2.	60	14000
3.	80	18000
4.	80	10000
5.	70	12000

(.....)

14. දේශීය කිරිනිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් ආණ්ඩුව විසින් කිරි ගොවියන් වෙත ලබා දෙන සහනාධාරය හේතුකොට ගෙන සැපයුම් වක්‍රය S සිට S_1 දක්වා විතැන් වූ ආකාරය පහත ප්‍රස්තාර සටහන පෙන්නුම් කරයි.



සහනාධාරයෙන් පසු නිෂ්පාදකයින්ගේ මුළු අයභාරය පෙන්නුම් කෙරෙන්නේ,

1. Op_2CQ_2 ප්‍රදේශයෙනි.
2. P_2P_3BC ප්‍රදේශයෙනි.
3. OP_3BQ_2 ප්‍රදේශයෙනි.
4. OP_3AQ_1 ප්‍රදේශයෙනි.
5. FP_3B ප්‍රදේශයෙනි.

(.....)

15. කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා වන වෙළෙඳපොලක සමතුලිතය පහත රූප සටහන මගින් පෙන්නුම් කරයි.



මෙම වෙළෙඳපොළ සිටින නිෂ්පාදකයින්ට, ඒකකයකට රු. 8 ක් වූ සහතික මිලක් ලබාදීමට රජය තීරණය කරයි. ආණ්ඩුව විසින් අතිරික්තය මිලදී ගැනීමේ මිල ආධාරක ප්‍රතිපත්තිය මගින් අවම මිල සහතික කිරීම හේතු කරගෙන නිෂ්පාදක අතිරික්තයෙහි හා පාරිභෝගික අතිරික්තයෙහි ප්‍රමාණය කොපමණද?

	පාරිභෝගික අතිරික්තය	නිෂ්පාදක අතිරික්තය
1.	රු. 90	රු. 90
2.	රු. 40	රු. 90
3.	රු. 90	රු. 40
4.	රු. 10	රු. 90
5.	රු. 40	රු. 10

(.....)

16. කෙටිකාලයේදී ආයතනයක මුළු පිරිවැය වක්‍රයේ හැඩය තීරණය වන්නේ,
1. සාමාන්‍ය ස්ථාවර පිරිවැයෙහි හැසිරීම මතය.
2. තාක්ෂණය වෙනස් වන ආකාරය මතය
3. සාමාන්‍ය මුළු පිරිවැයෙහි හැසිරීම මතය.
4. මුළු විචල්‍ය පිරිවයෙහි හැසිරීම මතය.
5. පරිමාණානුකූල ඵල හැසිරීම මතය

(.....)

17. ආයතනයක නිමැවුම වැඩි කිරීමත් සමඟ සාමාන්‍ය ස්ථාවර පිරිවැය අඛණ්ඩව පහත වැටෙන නමුදු එය ශූන්‍ය නොවන්නේ,
1. මුළු පිරිවැය වෙනස් නොවන බැවිනි.
2. විචල්‍ය පිරිවැයක් පවතින බැවිනි.
3. සාමාන්‍ය පිරිවැයක් පවතින බැවිනි.
4. ආන්තික පිරිවැයක් පවතින බැවිනි.
5. ස්ථාවර පිරිවැයක් පවතින බැවිනි.

(.....)

18. පූර්ණ තරඟ ආයතනයක සමතුලිතය තීරණය වන්නේ,
    1. ආන්තික පිරිවැය වැඩිවෙමින් පවතින අවධියේදී ආන්තික අයහාරය ආන්තික පිරිවැයට සමාන වන විටය.
    2. ආන්තික පිරිවැය අඩුවෙමින් පවතින අවධියේදී ආන්තික අයහාරය ආන්තික පිරිවැයට සමාන වන විටය.
    3. ආන්තික පිරිවැය අවම ලක්ෂ්‍යයේදී ආන්තික අයහාරය ආන්තික පිරිවැයට සමාන වීමයි.
    4. සාමාන්‍ය පිරිවැය වැඩි වෙමින් පවතින අවධියේදී ආන්තික අයහාරය ආන්තික පිරිවැයට සමාන වීමයි.
    5. සාමාන්‍ය පිරිවැය අඩු වෙමින් පවතින අවධියේදී ආන්තික අයහාරය ආන්තික පිරිවැයට සමාන වීමයි.

    (.....)

19. කෙටිකාලයේදී සාමාන්‍ය අයහාරය සාමාන්‍ය පිරිවැයට වඩා පහළින් පැවැතියද නිෂ්පාදනය අඛණ්ඩව පවත්වාගෙන යාම අර්ථවත් එකක් වනුයේ ආයතනයේ සාමාන්‍ය අයහාරය.
    1. සාමාන්‍ය ස්ථාවර පිරිවැයට වඩා වැඩි අගයක් ගනී නම්ය.
    2. ආන්තික පිරිවැයට වඩා වැඩි අගයක් ගනී නම්ය.
    3. සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩි අගයක් ගනී නම්ය.
    4. විචල්‍ය පිරිවැය සහ ස්ථාවර පිරිවැය යන දෙකෙහි එකතුවට වැඩි නම්ය.
    5. ආන්තික අයහාරයට වඩා වැඩි අගයක් ගනී නම්. (.....)

20. පහත රූප සටහනේ දැක්වෙන්නේ ප්‍රාග්ධනය හා ශ්‍රමය ඇතුළු සියලුම නිෂ්පාදන සාධකවල සේවා නියුක්තිය වැඩිකරන විට ආයතනයේ සාමාන්‍ය මුළු පිරිවැය වෙනස්වන ආකාරයයි.



    ආයතනය තම නිමැවුම් OQ_1 සිට OQ_2 දක්වා වැඩිකරන විට රූපප සටහන පෙන්නුම් කරන්නේ,
    1. ඒකාධිකාරී බලය නිසා හට ගනු ලබන ප්‍රතිලාභයන්ය.
    2. විශේෂ ප්‍රාගුණ්‍ය ඉහළයාම නිසා හටගනු ලබන ප්‍රතිලාභයන්ය.
    3. පරිමාණානුකූල නොපිරිමැසුම්ය.
    4. වැඩිවන පරිමාණානුකූල ඵල ය.
    5. නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ යාමය. (.....)

21. ව්‍යාපාර චක්‍රයක විවිධ අදියරයන්ගේ අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
    1. පසු බැසීම, පතුළ, ප්‍රසාරණය හා මුදුනත.
    2. පසු බැසීම, මුදුනත, ප්‍රසාරණය හා පතුළ
    3. පසු බැසීම, පතුළ, මුදුනත හා ප්‍රසාරණය
    4. පසුබැසීම, ප්‍රසාරණය, පතුළ හා මුදුනත
    5. පසු බැසීම, ප්‍රසාරණය, මුදුනත හා පතුළ (.....)

22. නිමැවුම් ප්‍රවේශයෙන් දළ දේශීය නිෂ්පාදිතයේ අගය ඇස්තමේන්තු කිරීමේදී ද්වි ගණනයක් සිදුවිය හැක්කේ,
    1. පැරණි භාණ්ඩවල වටිනාකම් සැලකීමෙනි.
    2. සංක්‍රාම වියදම් සැලකීමෙනි.
    3. ශුද්ධ වක්‍ර බදු සෘණ අගයක් ගැනීමෙනි
    4. අතරමැදි නිෂ්පාදනවල අගය ඇතුළත් වීමෙනි.
    5. ඒක පාර්ශ්වීය ආදායම් සැලකීමෙනි. (.....)

23. කිසියම් රටක් තුළ වර්ෂයකදී නිෂ්පාදිතය බිහි කිරීමට දායක වූ සාධක හිමියන් විසින් උපයා ගන්නා ලද මුළු ආදායමට වක්‍රබදු සහ ප්‍රාග්ධන ක්ෂය වීම් එකතු කර පිහිටාධාර අඩු කිරීමෙන් ගණනය කළ හැක්කේ,
    1. වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමයි.
    2. වෙළඳ මිලට ශුද්ධ දේශීය දේශීය නිෂ්පාදිතයේ වටිනාකමයි.
    3. වෙළඳ මිලට දළ ජාතික නිෂ්පාදිතයේ වටිනාකමයි.
    4. වෙළෙඳ මිලට ශුද්ධ ජාතික නිෂ්පාදිතයේ වටිනාකමයි.
    5. ස්ථාවර මිලට දළ ජාතික නිෂ්පාදිතයේ වටිනාකමයි. (.....)

24. නිෂ්පාදන ආයතනයක සේවයේ නියුතු සේවකයෙකුගේ මූර්ත වැටුපෙන් දැක්වෙන්නේ,
    1. මුදල් වැටුපේ ආවස්ථික පිරිවැයයි.
    2. මුදල් වැටුපේ මූර්ත අගයයි.
    3. නාමික වැටුපෙන් උද්ධමන අනුපාතිකය අඩුකළ පසු ලැබෙන අගයයි.
    4. ඔහුට මුදලින් ලැබෙන වැටුප් ප්‍රමාණයයි.
    5. උද්ධමන අනුපාතිකයෙත් නාමික වැටුපේත් එකතුවයි. (.....)

25. පහත දැක්වෙන ප්‍රකාශවලින් වැයකළ හැකි කුටුම්භ ආදායම් නිවැරදිව දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
    1. දළ ජාතික ආදායම - වක්‍ර බදු + නොබෙදූ ලාභ - සංක්‍රාම
    2. දළ ජාතික ආදායම + සංක්‍රාම - ආදායම් බදු - අපනයන
    3. දළ ජාතික ආදායම - වක්‍ර බදු + සංක්‍රාම - නොබෙදූ ලාභ
    4. දළ ජාතික ආදායම - සංක්‍රාම + වක්‍ර බදු + ක්ෂයවීම්
    5. දළ ජාතික ආදායම - කුටුම්බවල නොලැබූ ආදායම් - ආදායම් බදු + සංක්‍රාම

    (.....)

26. පවත්නා වෙළෙඳපොල මිල අනුව වර්තමානයේ (2016) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ අගය ආසන්න වශයෙන්,
    1. ඇමරිකානු ඩොලර් බිලියන 50 කි. 2. ඇමරිකානු ඩොලර් බිලියන 100 කි.
    3. ඇමරිකානු ඩොලර් බිලියන 980 කි. 4. ඇමරිකානු ඩොලර් බිලියන 75 කි.
    5. ඇමරිකානු ඩොලර් බිලියන 81 කි. (.....)

27. ආන්තික පරිභෝජන නැමියාව 0.8 ක් වන සරල ආර්ථිකයක, ස්වාධීන ආයෝජන රු. මිලියන 200 කින් වැඩිකළ විට, සමතුලිත ආදායමෙහි සිදුවන ප්‍රසාරණය වන්නේ,
    1. රු.මිලියන 1600 2. රු. මිලියන 1000 3. රු. මිලියන 400
    4. රු. මිලියන 200 5. රු. මිලයන 160 (.....)

28. එක්තරා කල්පිත සරල ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 450 + 0.6\,yd$ සිට $C = 425 + 0.75\,yd$ දක්වා වෙනස්වන විට, සමතුලිත ජාතික ආදායමේ සිදුවන වෙනස වන්නේ,
    1. රු.මිලියන 88 2. රු. මිලියන 875 3. රු. මිලියන 1700
    4. රු. මිලියන 250 5. රු. මිලයන 75 (.....)

29. සාර්ව ආර්ථික සමතුලිතය වඩාත් නිවැරදි ලෙස අර්ථකථනය වන්නේ පහත ප්‍රකාශ අතුරින් කුමන ප්‍රකාශයෙන්ද?
    1. එය නිෂ්පාදනය උපරිම වන ලක්ෂයකි.
    2. ආදායම් හා නිමවුම් මට්ටමෙහි වෙසක් ඇතිකරන බලවේග ක්‍රියාත්මක නොවන තත්ත්වයකි.
    3. එය ඉතුරුම් හා ආයෝජන සමාන වන තත්ත්වයකි.
    4. එය පූර්ණ සේවා නියුක්ති තත්ත්වයකි.
    5. උද්ධමන බලපෑමක් නොමැති තත්ත්වයකි. (.....)

30. එක්තරා කල්පිත ආර්ථිකයක සමාහාර වියදම් වක්‍රය පහත පරිදි වෙනස් වේ.



ඉහත කල්පිත ආර්ථිකයෙහි සමාහාර වියදම් වක්‍රය E සිට E_1 දක්වාත් E සිට E_2 දක්වාත් වෙනස් විය හැකි හේතූන් පිළිවෙලින් වන්නේ,
    1. සාමාන්‍ය පරිභොජන නැමියාවෙහි වැඩිවීමක් හා ආයෝජන ඉහළ යාමක්.
    2. ආන්තික ඉතුරුම් නැමියාවෙහි අඩුවීමක් හා රාජ්‍ය වියදම්වල ඉහළ යාමක්
    3. ආන්තික ඉතුරුම් නැමියාවෙහි වැඩිවීමත් හා ස්වාධීන බදු ඉහල යාමක්.
    4. ආන්තික ඉතුරුම් නැමියාවෙහි අඩුවීමක් හා ස්වාධීන බදු ඉහළ යාමක්.
    5. ආන්තික ඉතුරුම් නැමියාවෙහි වැඩි වීමක් හා රාජ්‍ය වියදම්වල ඉහළ යාමක්. (.....)

31. මිල මට්ටම ඉහළ යන විට,
    1. ස්ථාවර මූල්‍ය වත්කම් ලාභීන් ඔවුන්ගේ වියදම් වැඩිකර ගනියි.
    2. මුදල් සඳහා ඉල්ලුම හා පොලී අනුපාතිකය ඉහළ යයි.
    3. පොළී අනුපාතික වෙනස්වීම්වලට සංවේදී වියදම් වැඩි කෙරේ.
    4. ස්ථාවර මූල්‍ය වත්කම් ලාභීන්ගේ ක්‍රය ශක්තිය ඉහළයයි.
    5. මුදල් සඳහා ඉල්ලුම හා පොලී අනුපාතිකය පහළ යයි. (.....)

32. අනපේක්ෂිත උද්ධමනය තුළින් පීඩාවට පත් නොවන්නේ,
    1. ස්ථාවර නාමික ආදායම්ලාභීන්ය.
    2. අඩු ආදායම් ලාභීන්ය.
    3. මුදල් ඉතුරුම් ලාභීන්ය.
    4. මිල ගණන් අඩු මට්ටමේ පැවැතුණු අවස්ථාවේදී ණය ලැබුවන්ය.
    5. ඉදිරි ආයෝජන ප්‍රරෝකථන කරන්නන් ය. (.....)

33. මිල උද්ධමනය සඳහා බලපාන සැපයුම් පාර්ශ්වීය සාධකයක් වන්නේ,
    1. රජයේ වියදම් වැඩිවීම.
    2. ආයෝජන වියදම් වැඩිවීම
    3. ශුද්ධ අපනයන වැඩිවීම.
    4. යෙදවුම්වල මිල වැඩිවීම.
    5. මුදල් සැපයුම වැඩිවීම (.....)

34. පහත සඳහන් ප්‍රකාශනයන්ගෙන් පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමන න්‍යායට අදාළ නොවන්නේ කුමක්ද?
    1. සේවා නියුක්තියේ හා නිමැවුමේ වැඩිවීමක්
    2. ඒකක නිෂ්පාදනයේ වැඩිවීමක්
    3. අධික වැටුප් ලැබීමක්
    4. සැපයුම් පාර්ශ්වීය කම්පන
    5. ඉහත සඳහන් සියලුම කරුණු වේ. (.....)

35. කිසියම් කාල පරිච්ඡේදයක් තුළ රටක දළ දේශීය නිෂ්පාදිතයේ නාමික අගය පහළ වැටී ඇතැයි සිතන්න. එම කාලය තුළ එම රටේ පහළගොස් ඇතැයි නිගමනය කළ හැකි විචල්‍ය වන්නේ,
    1. වෙළඳ ශේෂයේ හිඟයයි.
    2. මූර්ත නිමවුමයි.
    3. අයවැය හිඟයයි.
    4. සමාහාර ඉල්ලුමයි.
    5. උද්ධමන අනුපාතයයි. (.....)

36. ආවෘත ආර්ථිකයක බැංකු පද්ධතිය තනි වාණිජ බැංකුවකින් සමන්විත වේ යැයි උපකල්පනය කරන්න. එහි සංචිත අනුපාතය 40% ක් වන අතර, රු. 8000 මුදලක් බැංකුවේ අලුතෙන් තැන්පත් කළ විට බැංකුවට ලබාදිය හැකි උපරිම ණය ප්‍රමාණය කොපමණ වේද?
    1. රු. 4200 2. රු. 4800 3. රු. 12000 4. රු. 20000 5. රු. 3200 (.....)

37. ශ්‍රී ලංකා මහ බැංකුව විවෘත වෙළෙඳපොලේ රජයේ සුරැකුම්පත් මිලදී ගැනීමක් සිදුකළවිටක එමගින් සිදුවන ප්‍රතිවිපාකය හඳුනාගන්න.
    1. බැංකුවල සංචිත අඩුවන අතර රටේ මුදල් සැපයුම අඩුවේ.
    2. බැංකුවල සංචිත අඩුවන අතර රටේ මුදල් වැඩිවේ.
    3. බැංකුවල සංචිත වැඩිවන අතර පදනම් මුදල් අඩුවේ.
    4. බැකුවල සංචිත වැඩිවන අතර පදනම් මුදල් වැඩිවේ.
    5. බැංකුවල සංචිත අඩුවන අතර පදනම් මුදල් අඩුවේ. (.....)

38. මහ බැකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතය මත නිත්‍ය තැන්පතු පහසුකම් වාණිජ බැංකුවලට ලබාදුන්විට ඇතිවන ප්‍රතිවිපාකය වන්නේ,
    1. ඒක්ෂණ ණය වෙළඳපොලේ පොලී පහළ යන අතර, පොලී අනුපාත කොරිඩෝවේ ඉහළ හා පහළ සීමා තීරණය වේ.
    2. ඒක්ෂණ ණය වෙළෙඳපොලේ පොලී වෙනස් නොවේ.
    3. ඒක්ෂණ පොලී ඉහළ යන අතර පොලී අනුපාත කොරිඩෝවේ පහළ සීමාව තීරණය වේ.
    4. ඒක්ෂන ණය වෙළෙඳපොලේ පොලී අඩුවන අතර පොලී අනුපාත කොරිඩෝවේ පහළ සීමාව තීරණය වේ.
    5. ඒක්ෂණ ණය වෙළඳපොලේ පොලී අඩුවන අතර පොලී අනුපාත කොරිඩෝවේ ඉහළ සීමාව තීරණයෙ ව්.
    (.....)

39. ඉහත සඳහන් වත්කම් අතුරින් අඩුම ද්‍රවශීලතාවයක් පවතින වත්කම ලෙස සැලකෙන්නේ,
1. භාණ්ඩාගාර බැදුම්කර 2. ඉල්ලුම් තැන්පතු 3. කාලීන තැන්පතු
4. ඒක්ෂණ ණය 5. ස්ථාවර තැන්පතු (.....)

40. වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මූලික අභිමතාර්ථය ලෙස සලකන්නේ,
1. ආර්ථික ස්ථායිතාවය ඇති කිරීමයි.
2. තිරසාර සංවර්ධනයක් ඇතිකිරීමයි
3. බදු ආදායම ඉහළ මට්ටමකට ගෙන ඒමයි
4. මුදල් සැපයුම සංකෝචනය කිරීමයි
5. මැදි කාලීන වශයෙන් උද්ධමනය මැදි තනි අගයක පවත්වා ගැනීමයි. (.....)

41. විදේශීය ආයෝජන සමාගමක් විසින් නිපදවන ලද භාණ්ඩ හා වෙළෙඳපොළ සමතුලිත නිමවුම සමාජීය වශයෙන් ප්‍රශස්ථ නිමවුම් මට්ටම ඉක්මවා ගොස් තිබුණි. අධි නිෂ්පාදනයක්ද බිහිවී ඇත්නම්, එම නිෂ්පාදනය මගින්,
1. සමාජයට හිතකර බලපෑම් සිදුවී තිබේ.
2. සමාජයට අහිතකර බලපෑම් ඇතිවී තිබේ.
3. පරිභෝජනයේ ප්‍රතිලාභ බිහිවී තිබේ.
4. පරිභෝජනයේ පිරිවැය බිහිවී තිබේ.
5. සමාජයට යහපත් නිෂ්පාදනයක් කර තිබේ. (.....)

42. 2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ බදු ආදායමෙන් රජයට වැඩිම දායකත්වයක් ලබාදී ඇත්තේ,
1. එකතුකළ අගය මත බදු 2. ආනයන බදු
3. ආදායම් බදු 4. නිෂ්පාදන බදු
5. වියදම් බදු (.....)

43. රජයක් විසින් බදු අයකරනු ලබන්නේ විවිධ අරමුණු ඉටුකර ගැනීම සඳහාය. පහත දැක්වෙන අරමුණු වලින් බදු අය කිරීමේ අරමුණක් නොවන්නේ,
1. පොදු භාණ්ඩ හා සුභ සාධන භාණ්ඩ සැපයීමයි.
2. සාධාරණත්වයක් ඇතිකර ගැනීමයි.
3. ගෙවුම් ශේෂ ගැටලු අඩුකර ගැනීමයි.
4. ආර්ථික වෘද්ධිය ඉහළ නංවා ගැනීමයි.
5. රාජ්‍ය ආදායම් වැඩිකර ගැනීමයි. (.....)

44. 2016 වර්ෂයේ රාජ්‍ය අයවැයේ වර්තන ගිණුමේ ශේෂය හා සමස්ථ ශේෂය ආසන්න වශයෙන් (ද.දේ.නි. ප්‍රතිශතය)

	සමස්ථ ශේෂය	**වර්ථන ශේෂය**
1.	- 6.2	- 1.1
2.	- 5.6	- 0.9
3.	- 6.4	- 1.2
4.	- 7.6	- 2.3
5.	- 5.4	- 0.6

(.....)

45. රාජ්‍ය ණය මෑත වර්ෂවල දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කවර අගයක් ගෙන තිබේද?
1. 79.3% 2. 82.3 % 3. 102.2 % 4. 92.1 % 5. 90.3% (.....)

46. ජපානය සහ ප්‍රංශය ශ්‍රමිකයෙකු මගින් පැයකදී කරනු ලබන නිමැවුම් පහත පරිදි වේ යැයි උපකල්පනය කරන්න.

	අභ්‍යාස පොත්	**පෑන්**
ජපානය	8	4
ප්‍රංශය	8	2

මෙම දත්තවලට අනුව ජපානය සහ ප්‍රංශය අතර පවතින නිදහස් වෙළඳාම සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශවලින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. ජපානය අභ්‍යාස පොත් අපනයනය කරන අතර, ප්‍රංශය පෑන් අපනයනය කරයි.
2. ජපානය පෑන් අපනයන කරන අතර, ප්‍රංශය අභ්‍යාස පොත් අපනයනය කරයි.
3. ජපානය අභ්‍යාස පොත් හා පෑන් යන දෙකම අපනයනය කරයි.
4. ප්‍රංශය අභ්‍යාස පොත් ආනයනය කරන අතර පෑන් අපනයනය කරයි.
5. ජපානය හා ප්‍රංශය රටවල් දෙකම භාණ්ඩ දෙකම නිෂ්පාදනය කරන අපනයනය කරයි. (.....)

47. විදේශ වෙළඳාම සම්බන්ධයෙන් ඇතිවිය හැකි අවාසියක් නොවන්නේ මින් කවරක්ද?
    1. දේශීය ළදරු කර්මාන්ත අධෛර්යමත් වීම.
    2. ප්‍රපතනය මගින් අවාසි ඇතිවීම.
    3. විදේශ වෙළෙඳාම මත පරායත්තතාව වැඩිවීම
    4. විදේශ ආයෝජන මත රඳාපැවැත්ම
    5. දේශීය ශුභසාධන මට්ටම ඉහළ යාම. (.....)

48. අන්තර්ජාතික වෙළෙඳාම තුළ ප්‍රපතනය (Dumping) යන සංකල්පයෙන් අදහස් වන්නේ,
    1. රටවල නීතිමය මුහුදු සීමාවන්ගෙන් පිටත ජාත්‍යන්තර මුහුදු දූෂණය කිරීම
    2. අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි අත්කර ගැනීමයි.
    3. සාමාන්‍ය නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිලට භාණ්ඩ අපනයනය කිරීමයි.
    4. සවර්ධිත රටවල් විසින් සංවර්ධනය වන රටවල් කරා ගුණාත්මකභාවයෙන් අඩු භාණ්ඩ අපනයනය කිරීමයි.
    5. අතිරික්ත නිෂ්පාදන විනාශ කිරීමයි. (.....)

49. 

ජපානය සහ කොරියාව යන රටවල් දෙක සඳහා කල්පිත නිෂ්පාදන හැකියා වක්‍ර දෙකක් ඉහත ප්‍රස්තාරයේ දැක්වේ. වෙළඳ බාධක කිසිවක් නැතැයි උපකල්පනය කළහොත්,
    1. X හා Y යන භාණ්ඩ වර්ග දෙකම පිළිබඳ සාපේක්ෂ වාසියක් ජපානයට ඇත.
    2. X හා Y යන භාණ්ඩ වර්ග දෙකම පිළිබඳව නිරපේක්ෂ වාසියක් කොරියාවට ඇත.
    3. කිසිදු රටකට වෙළඳාමෙන් වාසියක් ලබාගත නොහැකිය.
    4. රටවල් දෙකටම වෙළඳාමෙන් වාසි ලබාගත හැකිය.
    5. ජපානය කොරියාවට Y භාණ්ඩ අපනයනය කරනු ඇත. (.....)

50. 2016 ජනාවරි මාසයේ සිට දෙසැම්බර් මාසය වන විට ඇමරිකානු ඩොලරයක වටිනාකම රු. 150 සිට රු. 155 දක්වා වෙනස් වූයේය. මෙම වෙනස්වීම නිරූපනය කරන්නේ,
    1. රුපියලේ අගය ක්ෂය වීමකි.
    2. රුපියලේ අගය වැඩිවීමකි.
    3. රුපියලේ අගය ප්‍රතිප්‍රමාණය කිරීමකි.
    4. ඇමරිකානු ඩොලරයේ අගය ක්ෂය වීමකි.
    5. ඇමරිකානු ඩොලරය අවප්‍රමාණය වීමකි. (.....)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP
21 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Second Term Test - Grade 13 - 2018

විභාග අංකය ..... ආර්ථික විද්‍යාව II කාලය පැය තුනයි

❖ **''අ '' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද ''ආ'' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

අ උප කොටස

01). i. "නියං සමයට වර්ෂාව හිඟ බැවින්, වර්ෂා ජලය ආර්ථික භාණ්ඩයක් වේ'' . මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 4)

ii. පහත සඳහන් දෑ කුමන නිෂ්පාදන සම්පතකට අයත් වේද?

අ - ජල විදුලි බලාගාරය

ආ - වෛද්‍ය සායනයක රෝගීන් දැනුවත් කිරීම

ඇ - අර්ධ නිමි ඇඳුම් තොගයක්

ඉ - වන අලින් (කරුණකට ලකුණු 1 බැගින් ලකුණු 4)

iii. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත පිහිටි සෑම ලක්ෂ්‍යයකින්ම නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව පෙන්නුම් කළද ආර්ථිකයේ කාර්යක්ෂමතාව වක්‍රය මත පිහිටි එක් සුවිශේෂී ලක්ෂ්‍යයකට පමණක් සීමා වන්නේ ඇයි? රූප සටහනක් මගින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. නිෂ්පාදන සාධකයක් වශයෙන් ශ්‍රමය හා ව්‍යවසායකත්වය යන මානව සම්පත් අතර දක්නට ලැබෙන වෙනස්කම් කවරේද? (ලකුණු 4)

v. වෙළඳපොළ ආර්ථිකයක, ප්‍රධාන කාර්යයන් මිල මගින් විසඳා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

02). i. වුවමනාවක් සපුරා ගැනීම සඳහා ඉටුවිය යුතු කොන්දේසි කවරේද? (ලකුණු 2)

ii. ''අනෙකුත් සාධක නොවෙනස්ව පවතින විට ඉල්ලුම් ප්‍රමාණය එම භාණ්ඩයේ මිලෙහි ඍණ ශ්‍රිතයක් වේ'' මෙහි සඳහන් නොවෙනස්ව පවතිනවා යැයි උපකල්පනය කරනු ලබන සාධක 3 ක් සඳහන් කරන්න (ලකුණු 3)

iii. කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා අදාළ වෙළෙඳපොළ සැපයුම් වක්‍රයේ නම්‍යතාව අනම්‍ය වේ යැයි සලකන්න. මෙම භාණ්ඩය සඳහා විශේෂිත නිෂ්පාදන සහනාධාරයක් ලබාදීමට රජය තීරණය කරයි නම් සහනාධාරයේ වාසිය බෙදී යන ආකාරය සුදුසු රූපසටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. කිසියම් භාණ්ඩයක් සඳහා වෙළඳපල සමතුලිත මිල රු. 60 ක් වන අතර, සමතුලිත ප්‍රමාණය ඒකක 400 කි. භාණ්ඩයේ මිල රු. 50 ක් වන විට ඒකක 200 ක අධි ඉල්ලුමක් හට ගන්නා අතර එම මිලට ඒකක 300 ක් සපයනු ලබයි.

(අ) මෙම භාණ්ඩය සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත සමීකරණ මගින් දක්වන්න. (ලකුණු 4)

(ආ) රජය මෙම භාණ්ඩයේ ඒකකයක් මත රු. 10 ක විශේෂිත බද්දක් පැනවීමට තීරණය කළේ නම් බද්දෙන් පසු නව සමතුලිත මිල සහ නිෂ්පාදකයන්ට ලැබුණු මිල ගණනය කරන්න. (ලකුණු 4)

(ඉ) ඒකක බද්ද වෙනුවට මෙම භාණ්ඩය සඳහා ඒකකයකට රු. 70 ක අවම මිලක් සහතික කරමින් අතිරික්තය රජය මිලදී ගැනීමේ මිල, ආධාරක ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවයි නම් ඒ සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණද? (ලකුණු 3)

03). i. (අ) නිෂ්පාදන ශ්‍රිතය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) නිෂ්පාදන ක්‍රියාවලියේ කෙටිකාලය හා දිගු කාලය අතර වෙනස කුමක්ද? (ලකුණු 2)

ii. ප්‍රාමාණික ලාභ හා නිෂ්ප්‍රාමාණික ලාභ අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. කෙටිකාලයේදී නිෂ්පාදන ආයතනයක් ආර්ථික ලාභ ශූන්‍යවීම හෙවත් ප්‍රමාණික ලාභ ලැබීම රූප සටහනකින් පෙන්වා දෙන්න. (ලකුණු 4)

iv. වැඩිවන පරිමාණානුකූල ඵල යන්න හඳුන්වා වැඩිවන පරිමාණානුකූල ඵල හට ගැනීම කෙරහි බලපාන සාධක නම් කරන්න. (ලකුණු 4)

v. ඕනෑම ලක්ෂණ 4 ක් පදනම් කරගෙන පූර්ණ තරගය හා ඒකාධිකාරී තරගය සංසන්දනය කරන්න. (ලකුණු 4)

04). i. පෞද්ගලික පරිභෝජන වියදම්, ආයෝජන වියදම්, රජයේ මිලදී ගැනීම් හා ශුද්ධ අපනයන කෙටියෙන් අර්ථ දක්වන්න. (ලකුණු 6)

ii. ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ ක්‍රමවේදයට අනුව වෙළෙඳපල මිලට අනුව මුළු සම්පත් හා ඒවායේ උපයෝජනය පෙන්වා දෙන්න. (ලකුණු 4)

iii. කිසියම් කල්පිත ආර්ථික ක්‍රමයකට අදාළ සාර්ව ආර්ථික දත්ත කීහිපයක් පහත දැක්වේ. (වටිනාකම රු. බිලියන)

පෞද්ගලික පරිභෝජනය	650
ආණ්ඩුවේ මිලදී ගැනීම්	170
ද. දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය	180
තොග වෙනස්වීම300	
අපනයන	200
ආනයන	300
ශුද්ධ විදේශ සාධක ආදායම (ප්‍රාථමික ආදායම)	500
ශුද්ධ විදේශ පෞද්ගලික සංක්‍රාම	150

පහත දෑ ගණනය කරන්න.

අ). දළ දේශීය වියදම

ආ). වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය

ඇ) වෙළඳ මිලට දළ ජාතික ආදායම

ඈ) දේශීය ඉතුරුම්

ඉ) ජාතික ඉතුරුම් (ලකුණු 2 බැගින් 10)

05). i. වැය කළ හැකි ආදායමට අතිරේකව පරිභෝජන වියදම තීරණය වීම කෙරෙහි බලපාන වෙනත් සාධක නම් කරන්න. (ලකුණු 2)

ii. අ) සරල ආර්ථිකයක සමතුලිත ආදායම තීරණය වන ආකාරය රූප සටහනක් ආශ්‍රයෙන් දක්වන්න(ලකුණු 2)

ආ) විවෘත ආර්ථිකයක කාන්දුවීම් හා විදීම් නම් කොට ඒවා කාන්දුවීම් හා විදීම් ලෙස සැලකීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. රාජ්‍ය කටයුතු සහිත සංවෘත ආර්ථිකයක ඉතුරුම් ශ්‍රිතය $S = -175 + 0.25\,yd$ වන අතර මෙම ආර්ථිකයේ ආයෝජන රු. මිලියන 100 ක් ලෙස ද රාජ්‍ය මිල දී ගැනීම් රු. මිලියන 110 ක් ලෙසද ස්වාධීන බදු රු. මිලියන 100 ක් ලෙසද වේ.

අ) මෙම ආර්ථියේ සමතුලිත නිමවුම් මට්ටම ගණනය කරන්න. (ලකුනු 2)

ආ)බදු ගුණකය හා රාජ්‍ය වියදම් ගුණකය ගණනය කරන්න. (ලකුණු 2)

iv. උද්ධමන පරතරය (Inflationary gap) හා සේවා වියුක්ති පරතරය (unemployment gap) යන සංකල්ප රූප සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. රාජ්‍ය අංශයකින් තොර සංවෘත ආර්ථිකයක MPC 0.6 කි. ආයෝජන වියදම් මි. 200 කින් වැඩිවීම නිසා මෙම ආර්ථිකයේ ප්‍රථම වට 4 තුළ ආදායම වැඩිවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

ආ උප කොටස

06). i. උද්ධමනය යන්න නිර්වචනය කර උද්ධමනයක් පාලනය කිරීමට රජයකට ගත හැකි ක්‍රියාමාර්ග සඳහන් කරන්න. (ලකුණු 3)

ii. මිල දර්ශකයක් යනු කුමක්ද? ශ්‍රී ලංකාවේ භාවිතා වන ජාතික පාරිභෝගික මිල දර්ශකය හා කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 5)

iii. ප්‍රසර්පණ උද්ධමනය හා ජවන උද්ධමනය ආර්ථිකයේ මූල්‍ය පද්ධතියේ ක්‍රියාකාරිත්වය කෙරෙහි කෙසේ බලපාන්නේද? (ලකුණු 4)

iv. ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය හා පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. මුදල් තොගය හා පොදු මිල මට්ටම අතර සම්බන්ධතාවය විනිමය සමීකරණය ඇසුරින් දක්වන්න. (ලකුණු 4)

07). i. මුදල් මුදල් ලෙස ළඟ තබා ගැනීමෙන් මිනිසුන්ට කිසිදු ආදායමක් නොලැබේ. එසේ නම් මිනිසුන් මුදල් ළඟ තබා ගන්නේ ඇයි? (ලකුණු 3)

ii. වාණිජ බැංකුවල තැන්පතු මැවීම පිළිබඳ පවතින සීමා මොනවාද? (ලකුණු 3)

iii. වාණිජ බැංකු පද්ධතියක සරල ශේෂ පත්‍රයක් පහත දැක්වේ.

වගකීම්		වත්කම්	
ඉල්ලුම් තැන්පතු	400	සංචිත	80
		ණය	320
	400		400

මහජනයා සතු ව්‍යවහාර මුදල් මිලියන 480 ක් සහ බැංකු පද්ධතියේ මිලියන 40 ක අධි සංචිත පවතින බව සලකන්න.

අ) තැන්පතු ගුණකයේ අගය කොපමණද? (ලකුණු 2)

ආ) ණය මැවීම සම්පූර්ණ කළ විට මුදල් සැපයුම කොපමණද? (ලකුණු 2)

ඇ) සංචිත අනුපාතය 25% ක් වූ විටක ණය මැවීම සම්පූර්ණ කළ විට මුදල් සැපයුම කොපමණ වේද? (ලකුණු 2)

iv. වාණිජ බැංකුවල අධි ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමට මහ බැංකුව අනුගමනය කරන ක්‍රම මොනවාද? (ලකුණු 2)

v. රටක මුදල් සැපයුම අඩු කිරීම සඳහා මහ බැංකුව අනුගමනය කරන ක්‍රම මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 6)

08). i. වෙළඳපොල ආර්ථිකයකට රජය මැදිහත් විම සාධාරණීකරණය කළ හැකි වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. පරිභෝජනයේ ධන බාහිරතා පවතින විට වෙළඳපොල ක්‍රමය අසාර්ථක වන ආකාරය රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. රජයේ බදු නොවන ආදායම් මාර්ග මොනවාද? (ලකුණු 4)

iv. 2016 රජයේ වර්තන වියදම් සංයුතිය පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. රාජ්‍ය අයවැයේ ප්‍රාථමික හිඟය හා ශුද්ධ මූල්‍ය හිඟය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

09). i. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය යනුවෙන් කුමක් අදහස්වේද? (ලකුණු 2)

ii. ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා වැඩපිළිවෙළේ ඉලක්කයන් මොනවාද? (ලකුණු 3)

iii. 2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාව සඳහා හේතු වූ සාධක මොනවාද? (ලකුණු 3)

iv. විදේශ වෙළෙඳාමේ සාපේක්ෂ වාසිය හා නිරපේක්ෂ වාසිය අතර වෙනස පැහැදිලි කරන්න (ලකුණු 6)

v. නිදහස් විදේශ වෙළඳ කටයුතු වලට සම්බන්ධ වීමෙන් නොදියුණු රටවලට මුහුණ පෑමට සිදුවන අවාසි වලින් මිදීම සඳහා අනුගමනය කළ හැකි බදු නොවන ආරක්ෂක ක්‍රම නම් කරන්න. (ලකුණු 6)

10). i. අන්තර් ජාතික වෙළෙඳාමේ මූලාශ්‍ර දක්වන්න. (ලකුණු 4)

ii. කිසියම් රටක් විදේශ වෙළෙඳාමට සම්බන්ධ වීමෙන් අත්කරගත හැකි වාසි මොනවාද? (ලකුණු 4)

iii. පහත දැක්වෙන්නේ ඇමරිකා එක්සත් ජනපදය හා එක්සත් රාජධානිය පරිගණක හා මෝටර් රථ සම්බන්ධයෙන් සම්පත් ඒකකයක නිමැවුම් ප්‍රමාණයන්ය.

	ඇ.එ.ජ.	එක්සත් රාජධානිය
පරිගණක	2	10
මෝටර් රථ	5	6

(අ) භාණ්ඩ දෙක සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසි ඇති රට නම් කර හේතු දක්වන්න (ලකුණු 2)

(ආ) භාණ්ඩ දෙක සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි ඇති රට හේතු සහිතව පෙන්වා දෙන්න (ලකුණු 6)

iv. සාපේක්ෂ වාසි න්‍යායට පදනම් කර ගන්නා උපකල්පන මොනවාද? (ලකුණු 4)

2018 - දෙවන වාර පරීක්ෂණය
13 ශ්‍රේණිය - ආර්ථික විද්‍යාව

පිළිතුරු පත්‍රය

I කොටස

1)	4	11)	3	21)	1	31)	2	41)	2
2)	2	12)	2	22)	4	32)	4	42)	4
3)	3	13)	5	23)	1	33)	4	43)	5
4)	2	14)	3	24)	2	34)	1	44)	5
5)	1	15)	4	25)	5	35)	4	45)	1
6)	4	16)	4	26)	5	36)	3	46)	2
7)	5	17)	5	27)	2	37)	4	47)	5
8)	2	18)	1	28)	4	38)	3	48)	3
9)	4	19)	3	29)	2	39)	1	49)	4
10)	1	20)	3	30)	3	40)	4	50)	1

II කොටස

අ උප කොටස

01). **i.** **''නියං සමයට වර්ෂාව හිඟ බැවින්, වර්ෂා ජලය ආර්ථික භාණ්ඩයක් වේ'' . මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.** **(ලකුණු 4)**

ii. **පහත සඳහන් දෑ කුමන නිෂ්පාදන සම්පතකට අයත් වේද?**

අ - ජල විදුලි බලාගාරය

ආ - වෛද්‍ය සායනයක රෝගීන් දැනුවත් කිරීම

ඇ - අර්ධ නිමි ඇඳුම් තොගයක්

ඉ - වන අලින් **(කරුණකට ලකුණු 1 බැගින් ලකුණු 4)**

iii. **නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත පිහිටි සෑම ලක්ෂ්‍යයකින්ම නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව පෙන්නුම් කළද ආර්ථිකයේ කාර්යක්ෂමතාව වක්‍රය මත පිහිටි එක් සුවිශේෂී ලක්ෂ්‍යයකට පමණක් සීමා වන්නේ ඇයි? රූප සටහනක් මගින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.** **(ලකුණු 4)**

iv. **නිෂ්පාදන සාධකයක් වශයෙන් ශ්‍රමය හා ව්‍යවසායකත්වය යන මානව සම්පත් අතර දක්නට ලැබෙන වෙනස්කම් කවරේද?** **(ලකුණු 4)**

v. **වෙළඳපොළ ආර්ථිකයක, ප්‍රධාන කාර්යයන් මිල මගින් විසඳා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.** **(ලකුණු 4)**

---

i. - නිෂ්පාදනයේදී ආර්ථික සම්පත් උපයෝජනය කෙරෙන එනම් නිෂ්පාදනයේදී ආවස්ථික පිරිවැයක් දක්නට ලැබෙන භාණ්ඩ ආර්ථික භාණ්ඩ ලෙස හැඳින්වේ. **(ලකුණු 1)**

- ආර්ථික භාණ්ඩ සැපයුමෙහි හිඟකමක් දක්නට ලැබෙන නමුත්, සැපයුමෙහි හිඟකමක් පැවතුන පමණින්ම එය ආර්ථික භාණ්ඩයක් නොවේ. **(ලකුණු 1)**
- සැපයුමෙහි හිඟකමක් දක්නට ලැබුණද, නිෂ්පාදනය සඳහා සම්පත් පිරිවැයක් / ආවස්ථික පිරිවැයක් හට නොගන්නා බැවින් වර්ෂා ජලය ආර්ථික නොවන භාණ්ඩයක් වේ. **(ලකුණු 2)**

ii. අ - ප්‍රාග්ධනය ආ - ශ්‍රමය
ඇ - ප්‍රාග්ධනය ඉ - භූමිය **(කරුණකට ලකුණු 1 බැගින් ලකුණු 4)**

iii. - නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව යනු අවම නිෂ්පාදන පිරිවැයකින් උපරිම භාණ්ඩ හා සේවා සංයෝජනය නිෂ්පාදනය කිරීමයි. ඒ සඳහා පූර්ණ සේවා නියුක්තිය හා පූර්ණ නිෂ්පාදනය යන කොන්දේසි ඉටුවිය යුතු වන අතර, එවිට වක්‍රය මත කටයුතු කළ හැකිවේ. එබැවින් වක්‍රය මත පිහිටි සෑම ලක්ෂයයකින්ම නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව පිළිබිඹු කරයි.

- ආර්ථිකයේ කාර්යක්ෂමතාව අත්කර ගැනීම සඳහා නිෂ්පාදන කාර්යක්ෂමතාව සමඟ සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව අත්කරගත යුතුයි. එවිට ආර්ථිකය සතු සම්පත් පුරවැසියන්ගේ වුවමනා ඉටු කරගැනීම පිණිස කාර්යක්ෂමව උපයෝජනය කළ හැකිය. එහිදී භාණ්ඩයේ මිල හෙවත් ආන්තික පිරිවැය ආන්තික ප්‍රතිලාභ වලට සමාන විය යුතුය. ඊට අදාළ භාණ්ඩ සංයොජනය හැ. වක්‍රය මත පිහිටි එම සුවිශේෂී ලක්ෂ්‍යය වේ. **(ලකුණු 4)**

iv. - ව්‍යවසායකත්වය අවශේෂ නිෂ්පාදන සංයෝග කරමින් නිෂ්පාදන කටයුතු සංවිධානය කරයි.
- ශ්‍රමය නිෂ්පාදන කටයුත්තක් වෙනුවෙන් යොදන කායික හෝ මනස වෙහෙසයි
- ව්‍යවසායකත්වයේ ඉපයීම ලාභ හෝ අලාභයි. ශ්‍රමයේ ඉපයීම වැටුප් වේ.
- ව්‍යවසායකත්වයට උපයන ආදායම ධන හෝ ඍණ හෝ ශූන්‍ය විය හැකිය. නමුත් ශ්‍රමයේ ඉපැයීම ධන අගයක් ගනී.
- ව්‍යවසායකත්වය අවදානම් දරමින් කටයුතු සිදු කරන අතර, ශ්‍රම සාධකය සේවා නියුක්ත කිරීම නිසා අවදානමකට මුහුණ දීමට සිදුනොවේ.

(සංසන්දනාත්මකව වෙනස්කම් දක්වා ඇත්නම් එක් කරුණකට ල. 1 බැගින් කරුණු 4 ට ලකුණු 4)

v. - වෙළෙඳපොළ ආර්ථිකය ප්‍රධාන කාර්යයන් වන්නේ කුමක්, කෙසේ, කා සඳහා නිෂ්පාදනය කළ යුතුද යන මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමයි. මේ සඳහා මිල යන්ත්‍රණය යොදා ගනී.
- කුමක් කොපමණ නිෂ්පාදනය කළ යුතුද? භාණ්ඩ හා සාධක වෙළෙඳපොල වර්ග වලින් ලබා දෙන මිල සංඥා මත ලාභයක් ඉපැයිය හැකි භාණ්ඩ හා සේවා පමණක් නිෂ්පාදනය කිරීම සඳහා හිඟ සම්පත් බෙදා වෙන් කරයි.
- කෙසේ නිෂ්පාදනය කළ යුතුද? පවත්නා තාක්ෂණය හා සාධක වල මිල ගණන් සැලකිල්ලට ගනිමින් අවම පිරිවැය සහිත කාර්යක්ෂම ක්‍රම ශිල්පය තෝරා ගනියි.
- කා සඳහා නිෂ්පාදනය කළ යුතුද? සාධක වෙළෙඳපොළ මිල ගණන් හා සාධක සැපයුම් ප්‍රමාණය මත පුද්ගල ආදායම තීරණය වන බැවින් මිලදී ගැනීමේ ශක්තියක් ඇති අය සඳහා නිෂ්පාදිතය බෙදා හැරේ.

(කරුණකට ලකුණු 1 බැගින් ලකුණු 4)

---

02). **i. වුවමනාවක් සපුරා ගැනීම සඳහා ඉටුවිය යුතු කොන්දේසි කවරේද?** **(ලකුණු 2)**

ii. ''අනෙකුත් සාධක නොවෙනස්ව පවතින විට ඉල්ලුම් ප්‍රමාණය එම භාණ්ඩයේ මිලෙහි ඍණ ශ්‍රිතයක් වේ'' මෙහි සඳහන් නොවෙනස්ව පවතිනවා යැයි උපකල්පනය කරනු ලබන සාධක 3 ක් සඳහන් කරන්න

(ලකුණු 3)

iii. කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා අදාල වෙළෙඳපොළ සැපයුම් වක්‍රයේ නම්‍යතාව අනම්‍ය වේ යැයි සලකන්න. මෙම භාණ්ඩය සඳහා විශේෂිත නිෂ්පාදන සහනාධාරයක් ලබාදීමට රජය තීරණය කරයි නම් සහනාධාරයේ වාසිය බෙදී යන ආකාරය සුදුසු රූපසටහනක් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

iv. කිසියම් භාණ්ඩයක් සඳහා වෙළඳපල සමතුලිත මිල රු. 60 ක් වන අතර, සමතුලිත ප්‍රමාණය ඒකක 400 කි. භාණ්ඩයේ මිල රු. 50 ක් වන විට ඒකක 200 ක අධි ඉල්ලුමක් හට ගන්නා අතර එම මිලට ඒකක 300 ක් සපයනු ලබයි.

(අ) මෙම භාණ්ඩය සඳහා වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත සමීකරණ මගින් දක්වන්න. **(ලකුණු 4)**

(ආ) රජය මෙම භාණ්ඩයේ ඒකකයක් මත රු. 10 ක විශේෂිත බද්දක් පැනවීමට තීරණය කළේ නම් බද්දෙන් පසු නව සමතුලිත මිල සහ නිෂ්පාදකයන්ට ලැබුණු මිල ගණනය කරන්න. **(ලකුණු 4)**

(ඉ) ඒකක බද්ද වෙනුට මෙම භාණ්ඩය සඳහා ඒකකයකට රු. 70 ක අවම මිලක් සහතික කරමින් අතිරික්තය රජය මිලදී ගැනීමේ මිල, ආධාරක ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවයි නම් ඒ සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණද? **(ලකුණු 3)**

---

i. - භාණ්ඩයක් හෝ සේවාවක් පරිභෝජනයට ඇති කැමැත්ත
- ක්‍රය ශක්තිය / මිලදී ගැනීමේ හැකියාව
- මිලදී ගැනීමට සැලසුම් කිරීම

(කරුණු තුනම ඇත්නම් ලකුණු 2)

ii. - සම්බන්ධිත භාණ්ඩ වල මිල - පාරිභෝගික අදායම
- පාරිභෝගික රුචිය - අනාගතයේ අපේක්ෂිත මිල

(කරුණු 1 ට ලකුණු 1 බැගින් ලකුණු 3)

iii. කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා අදාල වෙළෙඳපොළ සැපයුම් වක්‍රයේ නම්‍යතාව අනම්‍ය වේ යැයි සලකන්න. මෙම ලබාදීමට රජය තීරණය කරයි නම් සහනාධාරයේ වාසිය බෙදී යන ආකාරය සුදුසු රූපසටහනක් මගින් පැහැදිලි කරන්න.



(නිවැරදි රූප සටහනට ලකුණු 2)

අනම්‍ය සැපයුමක් පවතින භාණ්ඩයකට නිෂ්පාදන සහනාධාරයක් ලබා දුන් විට එහි වැඩි වාසිය නිෂ්පාදකයාට හිමිවේ.

(පැහැදිලි කිරීමට ලකුණු 2)

iv. **(අ)** ඉල්ලුම් ශ්‍රිතය $b = \frac{100}{-10} = -10$

$400 = a - 10x\,60$

$= a - 600$

$1000 = a$

$Qd = 1000 - 10\,p$ **(ලකුණු 2)**

සැපයුම් ශ්‍රිතය $b = \frac{100}{10} = 10$

$Qs = a + 10p$

$400 = a + 10x\,60$

$400 = a + 600$

$400 - 600 = a$

$-200 = a$

$Qs = -200 + 10p$ **(ල.2)**

(ආ) බද්දෙන් පසු සැපයුම් සමීකරණය

$Q_{st} = -200 + 10\,(p - 10)$

$= -200 + 10P - 100$

$= -300 + 10p$

සමතුලිතයේදී $Qd = Q_{st}$ නිසා

$1000 - 10P = -300 + 10P$

$1300 = 20\,P$

$\frac{1300}{20} = P$

$65 = P$

බද්දෙන් පසු නව සමතුලිත මිල රු. 65 **(ල. 2)**

- බද්දෙන් පසු නිෂ්පාදකයාට ලැබුණු මිල
= නව සමතුලිත මිල - ඒකක බද්ද
= රු. 65 - රු. 10
= රු. 55 **(ල. 2)**

(ඉ) **රු.**70 දී ඉල්ලුම් ප්‍රමාණය

Qd = 1000 – 10 x 70

= 1000 – 700

= 300

රු.70 දී සැපයුම් ප්‍රමාණය

Qd = -200 + 10 x 70

= -200 + 700

= 500

අධි සැපයුම = 500 - 300

= 200 **(ල.1)**

අතිරික්තය මිලට ගැනීම සඳහා ආණ්ඩුවේ වියදම = 200 x 70

= <u>රු. 14000</u> **(ල.2)**

(රූපසටහන් ආශ්‍රයෙන් පිළිතුරු සැපයීමට ලකුණු ලබාදිය හැක)

---

03). **i.** **(අ) නිෂ්පාදන ශ්‍රිතය යන්න පැහැදිලි කරන්න.** **(ලකුණු 2)**

(ආ) නිෂ්පාදන ක්‍රියාවලියේ කෙටිකාලය හා දිගු කාලය අතර වෙනස කුමක්ද? **(ලකුණු 2)**

ii. **ප්‍රාමාණික ලාභ හා නිෂ්ප්‍රාමාණික ලාභ අතර වෙනස පැහැදිලි කරන්න.** **(ලකුණු 4)**

iii. **කෙටිකාලයේදී නිෂ්පාදන ආයතනයක් ආර්ථික ලාභ ශූන්‍යවීම හෙවත් ප්‍රමාණික ලාභ ලැබීම රූප සටහනකින් පෙන්වා දෙන්න.** **(ලකුණු 4)**

iv. **වැඩිවන පරිමාණානුකූල ඵල යන්න හඳුන්වා වැඩිවන පරිමාණානුකූල ඵල හට ගැනීම කෙරහි බලපාන සාධක නම් කරන්න.** **(ලකුණු 4)**

v. **ඕනෑම ලක්ෂණ 4 ක් පදනම් කරගෙන පූර්ණ තරගය හා ඒකාධිකාරී තරගය සංසන්දනය කරන්න.** **(ලකුණු 4)**

---

i. **(අ)** නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදවුම් හා නිමැවුම් අතර පවත්නා තාක්ෂණික සම්බන්ධතාව නිෂ්පාදන ශ්‍රිතය නම් වේ.

- එය $Q = f\,(L,K)$ ලෙස දැක්විය හැකිය **(ලකුණු 2)**

(ආ) නිෂ්පාදන ක්‍රියාවලියේදී නිෂ්පාදනය සඳහා යොදාගන්නා ඇතැම් යෙදවුම් අවම වශයෙන් එක් සාධකයක්වත් වෙන්කළ නොහැකි කාලය කෙටිකාලය ලෙස හැඳින්වේ.

- එම නිසා කෙටි කාලයේ ස්ථාවර යෙදවුම් හා විචල්‍ය යෙදවුම් වශයෙන් සාධක දෙවර්ගයක් දැකිය හැකිය.

- කෙටි කාලයේ දී හීන ආන්තික ඵලදා නීතිය ක්‍රියාත්මක වේ. **(ලකුණු 2)**
- දිගු කාලය යනු සියලු යෙදවුම් වෙනස් කරමින් නිමැවුම වෙනස් කළ හැකි කාලය යි.
- දිගු කාලයේ දී සියලු යෙදවුම් විචල්‍ය යෙදවුම් වලින් පමණක් සමන්විත වේ
- දිගු කාලයේ දී පරිමාණානුකූල ඵල නීතිය ක්‍රියාත්මක වේ. **(ලකුණු 2)**

ii. - ප්‍රමාණික ලාභ (Normal Profit) යනු කිසියම් ව්‍යවසායකයෙකු පවත්නා නිෂ්පාදන ක්‍රියාවලියෙහි රඳවා තබා ගැනීම සඳහා එම ව්‍යවසායකයා අපේක්ෂා කරන අවම ගෙවීමය. **(ලකුණු 1)**

- ව්‍යවසායක කාර්යන් ඉටුකිරීම වෙනුවෙන් ලැබිය යුතු ගෙවීමක් මත නිසි ප්‍රමාණික ලාභය ආරෝපිත පිරිවැයකි පවත්නා නිෂ්පාදන ක්‍රියාවලිය තුළ එම අවම ගෙවීමවත් ඔහුට නොලැබේ නම් ව්‍යාපාරයෙන් තම ව්‍යවසායකත්වය ඉවත් කර ගනී. **(ලකුණු 1)**
- නිෂ්ප්‍රාමාණික ලාභ (Super Normal Profit) යනු නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගත් සියලුම සම්පත්වල ආවස්ථික පිරිවැය ඉක්මවා ලැබෙන අතිරික්තයයි **(ලකුණු 1)**
- ආර්ථික ලාභ ලෙස හඳුන්වන්නේද නිෂ්ප්‍රමාණික ලාභයමය
- නිෂ්ප්‍රාමාණික ලාභ ලැබිය හැක්කේ මුළු අයභාරය මුළු පිරිවැය ඉක්මවා ගියවිට පමණි. **(ලකුණු 1)**

iii. ආර්ථික ලාභය ශූන්‍ය වන විට මුළු අයභාරය මුළු පිරිවැයට සමාන වේ. එසේම ඒකකයක මිල (P) අවම සාමාන්‍ය පිරිවැයට (AC) සමාන වේ. එවිට ආයතනය ප්‍රාමාණික ලාභ ලබයි.



- ඉහත රූප සටහනට අනුව MC = MR වන විට ආයතනය ප්‍රාමාණික ලාභ ලබයි.

(රූප සටහනට ල. 2 යි. පැහැදිලි කිරීමට ල. 2)

iv. - පරිමාණානුකූල ඵල යනු දිගුකාලයේදී ආයතනයක ධාරිතාව පුළුල් කිරීමත් සමඟ නිෂ්පාදන සාධකවල කාර්යක්ෂමතාව ඉහළ යාමෙන් අත්කර ගනු ලබන මූර්ත ප්‍රතිලාභයයි.

- දිගුකාලයේදී සියලු යෙදවුම් වෙනස් කරන ප්‍රතිශතයට වඩා විශාල ප්‍රතිශතයකින් නිමැවුම වර්ධනය වීම වැඩෙන පරිමාණානුකූල ඵල යන්නෙන් අදහස් වේ.

උදාහරණ - යෙදවුම් 50% කින් වැඩිකරන විට නිමැවුම 80% කින් වර්ධනය වේ. **(ලකුණු 2)**

- වැඩිවන පරිමාණානුකූල ඵල හට ගැනීමට බලපාන සාධක
  - නිෂ්පාදන සාධකවල අභජ්‍යතාව හෙවත් නොබෙදිය හැකි යෙදවුම් තිබීම.
  - ශ්‍රම විභජනය මඟින් විශේෂ ප්‍රාගුණ්‍ය කිරීමේ හැකියාව
  - යන්ත්‍ර භාවිත කිරීමේ හැකියාව
  - එක් වරකදී පමණක් දැරිය යුතු වියදම් තිබීම **(කරුණු 2 කට ල. 2 යි)**

v.

ලක්ෂණය	පූර්ණ තරගය	ඒකාධිකාරී තරගය
1. ආයතන සංඛ්‍යාව	අතිවිශාල වේ	විශාල වේ
2. නිපදවන භාණ්ඩ වල ස්වරූපය	සමාජාතීය භාණ්ඩ වේ. උදා - වී, කැරට්	ප්‍රභේදිත භාණ්ඩ වේ. උදා - ආපන ශාලා, බාබර් සාප්පු
3. පිවිසුම හා පිටවීම	අබාධ ප්‍රවේශය හා පිටවීම	අබාධයි
4. මිල තීරණය	මිල ගනුවෙකි, පැවරුණු මිලක් අනුව ආයතන කටයුතු කරයි. P = MC	මිල තීරකයෙකි P >MC
5. ඉල්ලුම් වක්‍රය	ආයතනයක ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ.	පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයකි.

(ඕනෑම ලක්ෂණ 4 කින් සැසඳේ නම් ලකුණු 4)

04). **i.** **පෞද්ගලික පරිභෝජන වියදම්, ආයෝජන වියදම්, රජයේ මිලදී ගැනීම් හා ශුද්ධ අපනයන කෙටියෙන් අර්ථ දක්වන්න.** **(ලකුණු 6)**

ii. **ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ ක්‍රමවේදයට අනුව වෙළඳපල මිලට අනුව මුළු සම්පත් හා ඒවායේ උපයෝජනය පෙන්වා දෙන්න.** **(ලකුණු 4)**

iii. **කිසියම් කල්පිත ආර්ථික ක්‍රමයකට අදාළ සාර්ව ආර්ථික දත්ත කීහිපයක් පහත දැක්වේ. (වටිනාකම රු. බිලියන)**

පෞද්ගලික පරිභෝජනය	650
ආණ්ඩුවේ මිලදී ගැනීම්	170
ද. දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය	180
තොග වෙනස්වීම	300
අපනයන	200
ආනයන	300
ශුද්ධ විදේශ සාධක ආදායම (ප්‍රාථමික ආදායම)	500
ශුද්ධ විදේශ පෞද්ගලික සංක්‍රාම	150

පහත දෑ ගණනය කරන්න.

අ). දළ දේශීය වියදම **ආ). වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය**

ඇ) වෙළඳ මිලට දළ ජාතික ආදායම **ඈ) දේශීය ඉතුරුම්**

ඉ) ජාතික ඉතුරුම් **(ලකුණු 2 බැගින් 10)**

---

i. - පෞද්ගලික පරිභෝජන වියදම් යනු පරිභෝජන භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා කුටුම්බ විසින් කරනු ලබන වියදම්ය.

- ආයෝජන වියදම් යනු ස්ථාවර ප්‍රාග්ධන වත්කම් ලෙස හඳුන්වන යන්ත්‍ර සූත්‍ර, කම්හල්, නිවාස අත්පත් කර ගැනීම සඳහා දරණ වියදමයි. එයට තොග වෙනස්වීම්ද ගලපා ද.දේ. ප්‍රාග්ධන සම්පාදනය (දළ ආයෝජන) ගණනය කෙරේ.
- රජයේ මිලදී ගැනීම් යනු රජය විසින් මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවා සඳහා දරණ වියදම්ය. එයට රජයේ පරිභෝජන වියදම් මෙන්ම ආයෝජන වියදම්ද ඇතුලත්වේ.
- ශුද්ධ අපනයන යනු භාණ්ඩ හා සේවා අපනයන හා ආනයන අතර වෙනසයි. **(ලකුණු 6)**

ii. සම්පත් - දළ දේශීය නිෂ්පාදනය - භාණ්ඩ හා සේවා ආනයන **(ලකුණු 2)**

සම්පත් උපයෝජනය - පරිභෝජනය
- දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය
- තොග වෙනස්වීම
- භාණ්ඩ හා සේවා අපනයන **(ලකුණු 2)**

iii. **අ).** ද.දේ. වියදම $= C + I + G$

$= 650 + (180 + 300) + 170$

$= \underline{1300}$ **(ලකුණු 2)**

ආ). වෙළඳ මිලට ද. දේශීය නිෂ්පාදිතය $= C + I + G + X - M$

ද.දේ. වියදම + ශුද්ධ අපනයන

$1300 + (-100) = \underline{1200}$ **(ලකුණු 2)**

ඇ) වෙළඳ මිලට දළ ජාතික ආදායම = වෙ.මිලට ද.දේ.නි + විදේශ ශුද්ධ සාධක ආදායම

$1200 + 500 = 1700$ **(ලකුණු 2)**

ඉ) දේශීය ඉතුරුම් = ද.දේ. ප්‍රාග්ධන සම්පාදනය + ශුද්ධ අපනයන

$180 + 300 + (-100) = 380$ **(ලකුණු 2)**

ඊ) ජාතික ඉතුරුම් = දේශීය ඉතුරුම් + විදේශ ශුද්ධ සාධක ආදායම + ශුද්ධ විදේශ පෞද්ගලික සංක්‍රාම

$380 + 500 + 150 = 1030$ **(ලකුණු 2)**

---

05). **i.** **වැය කළ හැකි ආදායමට අතිරේකව පරිභෝජන වියදම තීරණය වීම කෙරෙහි බලපාන වෙනත් සාධක නම් කරන්න.** **(ලකුණු 2)**

ii. **අ) සරල ආර්ථිකයක සමතුලිත ආදායම තීරණය වන ආකාරය රූප සටහනක් ආශ්‍රයෙන් දක්වන්න(ලකුණු 2)**

ආ) විවෘත ආර්ථිකයක කාන්දුවීම් හා විදීම් නම් කොට ඒවා කාන්දුවීම් හා විදීම් ලෙස සැලකීමට හේතු පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

iii. **රාජ්‍ය කටයුතු සහිත සංවෘත ආර්ථිකයක ඉතුරුම් ශ්‍රිතය $S = -175 + 0.25\,yd$ වන අතර මෙම ආර්ථිකයේ ආයෝජන රු. මිලියන 100 ක් ලෙස ද රාජ්‍ය මිල දී ගැනීම් රු. මිලියන 110 ක් ලෙසද ස්වාධීන බදු රු. මිලියන 100 ක් ලෙසද වේ.**

අ) මෙම ආර්ථියේ සමතුලිත නිමවුම් මට්ටම ගණනය කරන්න. **(ලකුනු 2)**

ආ)බදු ගුණකය හා රාජ්‍ය වියදම් ගුණකය ගණනය කරන්න. **(ලකුණු 2)**

iv. **උද්ධමන පරතරය (Inflationary gap) හා සේවා වියුක්ති පරතරය (unemployment gap) යන සංකල්ප රූප සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.** **(ලකුණු 4)**

v. **රාජ්‍ය අංශයකින් තොර සංවෘත ආර්ථිකයක MPC 0.6 කි. ආයෝජන වියදම් මි. 200 කින් වැඩිවීම නිසා මෙම ආර්ථිකයේ ප්‍රථම වට 4 තුළ ආදායම වැඩිවන ආකාරය පැහැදිලි කරන්න.** **(ලකුණු 4)**

---

i. - කුටුම්භ සතු ධනය (වත්කම් තොග) - කුටුම්භවල අපේක්ෂණ
- කුටුම්භ විසින් ගනු ලබන ණය - මිල මට්ටම / අපේක්ෂිත උද්ධමනය

(ඕනෑම කරුණු 2 කට ලකුණු 2)

ii. **අ)**



Y_F - සමතුලිත ආදායම

Y = E
Y = C + J
W = J
S = J (ල. 02)

ආ) විවෘත ආර්ථිකයක කාන්දුවීම් - ඉතුරුම් (S), බදු (T) හා ආනයන (M) **(ලකුණු 1)**
විදීම - ආයෝජනය (I), රාජ්‍ය විදයම් (G) හා අපනයන (X) **(ලකුණු 1)**

- ඉතුරුම්, බදු හා ආනයන කාන්දුවීම් ලෙස සැලකෙන්නේ, ඒවා ආදායම් ප්‍රවාහයෙන් වියදම් ප්‍රවාහයට එකතු නොවී බැහැරට ගලා යන නිසාය. මේ නිසා සමහර ඉල්ලුම අඩු වී ආර්ථිකය සංකෝචනය වේ. **(ල.01)**
- ආයෝජනය, රාජ්‍ය වියදම් හා අපනයන විදීම් ලෙස සැලකෙන්නේ, ඒවා ආදායම් ප්‍රවාහයට නැවත එකතු වී ආර්ථිකයෙහි සමාහාර ඉල්ලුම ඉහළ යාමට හේතු වන නිසාත් එමඟින් ආර්ථිකය තුළ ප්‍රසාරාත්මක බලපෑමක් සිදුවන නිසාත්ය. **(ල. 1)**

iii. **අ)**

$$Y = C + G + I$$
$$= 175 + 0.75 (y - 100) + 100 + 110$$
$$= 175 + 0.75 y - 75 + 210$$
$$= 310 + 0.75 y$$
$$y - 0.75 y = 310$$
$$0.25 y = 310$$
$$y = \frac{310}{0.25} \quad \text{(ල. 02)}$$
$$\underline{y = 1240}$$

ආ) $K_T = \frac{b}{1-b}$

$= \frac{0.75}{0.25}$

$= \underline{3}$ **(ල. 1)**

$K_T = \frac{1}{1-b}$

$K_T = \frac{1}{0.25}$

$= \underline{4}$ **(ල.1)**

iv.



(රූප සටහන ලකුණු 02)

පූර්ණ සේවා නියුක්ත සමතුලිත නිමවුම් මට්ටම

උද්ධමන පරතරය - A – B අතර වෙනස (ල.1)
සේවා වියුක්ත පරතරය - $Y_F - y_1$ අතර වෙනස (ල.1)

v. - 1 වටය - රු. මිලියන 200
- 2 වටය - 200 x 0.6 = 120 රු. මිලියන 320
- 3 වටය - 120 x 0.6 = 72 රු. මිලියන 392
- 4 වටය - 72 x 0.6 = 43.2 රු. මිලියන 43.2 (ල. 04)

ආ උප කොටස

---

06). **i. උද්ධමනය යන්න නිර්වචනය කර උද්ධමනයක් පාලනය කිරීමට රජයකට ගත හැකි ක්‍රියාමාර්ග සඳහන් කරන්න. (ලකුණු 3)**

ii. මිල දර්ශකයක් යනු කුමක්ද? ශ්‍රී ලංකාවේ භාවිතා වන ජාතික පාරිභෝගික මිල දර්ශකය හා කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 5)

iii. ප්‍රසර්පණ උද්ධමනය හා ජවන උද්ධමනය ආර්ථිකයේ මූල්‍ය පද්ධතියේ ක්‍රියාකාරිත්වය කෙරෙහි කෙසේ බලපාන්නේද? (ලකුණු 4)

iv. ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය හා පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. මුදල් තොගය හා පොදු මිල මට්ටම අතර සම්බන්ධතාවය විනිමය සමීකරණය ඇසුරින් දක්වන්න. (ලකුණු 4)

---

i. උද්ධමනය - පොදු මිල මට්ටම කාලයක් තිස්සේ අඛණ්ඩව ඉහළ යාම උද්ධමනය වශයෙන් හැඳින්වේ. එහෙත් පොදු මිල මට්ටම කෙටි කාලයක් තුළ ඉහළ යාම උද්ධමනයක් වශයෙන් නොසැලකේ. එසේම උද්ධමනයක් ඇතිවීම සඳහා සියලුම භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාම අවශ්‍ය නොවේ. උද්ධමන කාලයකදී වුවද ඇතැම් භාණ්ඩ හා සේවාවල මිල ස්ථාවරව පැවතිය හැකිය. එසේම තවත් භාණ්ඩ හා සේවාවල මිල පහළ යා හැකිය. එහෙයින් උද්ධමනයක් ඇතිවන්නේ සියලුම භාණ්ඩ හා සේවාවල සාමාන්‍ය අගය ඉහළ යාමෙනි. **(ලකුණු 1)**

උද්ධමනය පාලනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග
- මූල්‍ය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති යොදාගනිමින් සමාහාර ඉල්ලුමේ වර්ධනය සීමා කිරීම
- සමාහාර සැපයුමේ වර්ධනය වේගවත් කිරීම
- ඍජු රාජ්‍ය මැදිහත් වීම
- කාර්යක්ෂමව සම්පත් බෙදාහැරීමට ඇති බාධක ඉවත් කිරීම **(කරුණු 2 ට ලකුණු 2 යි)**

ii. කාලච්ඡේද දෙකක් අතර මිල මට්ටමේ ඇතිවන වෙනස්වීම් මැන දක්වනු ලබන්නේ මිල දර්ශක මගිනි. එක් කාලච්ඡේදයකට සාපේක්ෂව අදාළ කාලච්ඡේදයේ මිල මට්ටමේ වෙනස්වීම ප්‍රතිශතයක් වශයෙන් මැන දැක්වීම මිල දර්ශක මගින් කෙරේ. **(ලකුණු 1)**

විශේෂ ලක්ෂණ	**ජාතික පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය**	**කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය**
1. පදනම් වර්ෂය	2013 = 100	2006/07 = 100
2. භූගෝලීය ලක්ෂණ	ශ්‍රී ලංකාවේ සියලුම පළාත්	කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම නාගරික ප්‍රදේශ
3. ඉලක්කගත ගෘහස්ථ ඒකක	සෑම පළාතකම සියලුම ගෘහ ඒකක	කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශයේ සියලුම ගෘහ ඒකක
4. ගෘහස්ථ ඒකකවල ප්‍රමාණය	3.9	4.4
5. සාමාන්‍ය මාසික පාරිභෝජන වියදම	රු. 32,142.69	රු. 27,972.11
6. ප්‍රධාන කාණ්ඩායම්, උප කණ්ඩායම්	12 105	10 95
7. අයිතම්වල එකතුව	407	373
8. සමස්ථ බර තැබීමේ ප්‍රතිශතය 1) ආහාර 2) ආහාර නොවන දේ	 44.04 55.96	 41.03 58.97
9. මිල ගණන් එකතු කිරීමේ මධ්‍යස්ථාන	සෑම ඒකකයක් සඳහාම සෑම දිස්ත්‍රික්කයකම මිල ගණන් එකතු කිරීමේ මධ්‍යස්ථාන 03	කොළඹ නාගරික ප්‍රදේශ ආවරණය වන ආකාරයට මිල ගණන් එකතු කිරීමේ මධ්‍යස්ථාන 14

(ඕනෑම වෙනස්කම් 2 කට ලකුණු 2 බැගින් ලකුණු 4 යි)
(මුළු ලකුණු 5)

iii. භාණ්ඩ හා සේවාවල පොදු මිල මට්ටම දිගු කලක් තිස්සේ මධ්‍යස්ථව හා මන්දගාමීව අනවරත වේගයකින් ඉහළ යාම ප්‍රාසර්පණ උද්ධමනයයි.
වාර්ෂික සාමාන්‍ය උද්ධමන වේගය 5% ට අඩුවන විට ප්‍රසර්පණ උද්ධමනයක් පවතී යැයි සැලකේ.
ඉතා ඉහළ වේගයෙන් භාණ්ඩ හා සේවාවල මිල මට්ටම් ඉහළ යාම ජවන උද්ධමනයයි. වර්ෂයකට ඉලක්කම් දෙකක හෝ තුනක වේගයෙන් භාණ්ඩ හා සේවාවල පොදු මිල මට්ටම ඉහළ යාමක් සිදුවේ. **(ලකුණු 2)**

- ප්‍රසර්පණ උද්ධමන තත්වයකදී මිල ඉහළ යාමේ වේගය පුරෝකථනය කළ හැකිය. එසේම මිල ගණන් සාපේක්ෂ වශයෙන් ස්ථාවර මට්ටමක පවතින බැවින් මුදලේ අගය වේගයෙන් අඩු නොවේ. එහෙයින් ජනතාව මූල්‍ය වත්කම් රැස් කිරීමට වැඩි කැමැත්තක් දක්වයි. එවිට මූල්‍ය පද්ධතිය හොඳින් ක්‍රියාත්මක වේ. **(ලකුණු 1)**
- නමුත් ජවන උද්ධමනයකදී භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉලක්කම් දෙකක හෝ තුනක වේගයෙන් ඉහළ යන බැවින් මුදලේ ක්‍රය ශක්තිය විශාල වශයෙන් පහත වැටේ. එහෙයින් මුදල් ළඟ තබා ගැනීමට ජනතාව දක්වන්නේ අඩු කැමැත්තකි. භාණ්ඩ රාශිකරණයට හා නිශ්චල දේපළ මිලදී ගැනීමට ජනතාව පෙළඹෙන බැවින් මූල්‍ය පද්ධතියේ ක්‍රියාකාරිත්වයට බාධා පැමිණේ. **(ලකුණු 1)**

(මුළු ලකුණු 04)

iv. භාණ්ඩ හෝ සාධක සඳහා පවත්නා සමාහාර ඉල්ලුම සමාහාර සැපයුම ඉක්මවා ඉහළ යාම හේතුවෙන් ඇතිවන උද්ධමනය හැඳින්වෙන්නේ ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය ලෙසය. ස්වාධීන පාරිභෝජනය, ස්වාධීන ආයෝජනය, රජයේ වියදම, ස්වාධීන අපනයන යන ඒවා වැඩිවීමත් ස්වාධීන ආනයනය ස්වාධීන බදු යන ඒවා අඩුවීමත් සමාහාර ඉල්ලුම වැඩිවීමට හේතු වේ. **(ලකුණු 2)**

පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය යනු නිෂ්පාදන පිරිවැය ඉහළ යාමෙන් පොදු මිල මට්ටම ඉහළ යාමයි. ආනයනික අමුද්‍රව්‍ය මිල ඉහළ යාම, ව්‍යෘත්තීය සමිති ක්‍රියා මාර්ගයක ප්‍රතිඵලයක් ලෙස වැටුප් ඉහළ යාම, බැංකු පොලී අනුපාතිකය ඉහළ නැංවීම, විනිමය අනුපාතය පහළ යාම මීට හේතුවයි. **(ලකුණු 2)**

(මුළු ලකුණු 04)

v. මුදල් තොගය හා පොදු මිල මට්ටම අතර අනුලෝම සම්බන්ධතාවක් ඇති බව මුදල් ප්‍රමාණ වාදයේ අදහසයි. එනම් මුදල් ප්‍රමාණයේ හට ගන්නා වෙනස්වීමක් මිල මට්ටමේ සමානුපාතික වෙනසක් ඇති කරනු ලැබේ. **(ලකුණු 2)**

මුදල් ප්‍රමාණවාදය, මුදල් ප්‍රමාණය හා මිල මට්ටම අතර සම්බන්ධතාවය MV = PT (MV = PY) යන විනිමය සමීකරණය තුළින් දක්වයි.

මෙම සමීකරණය තුළ අඩංගු විචල්‍යයන්ගේ හැසිරීම සම්බන්ධයෙන් කරනු ලබන උපකල්පන පදනම් කරගනිමින් විනිමය සමීකරණය න්‍යායක් බවට පත්කරගත හැකිය. ඒ සඳහා යොදා ගැනෙන උපකල්පන දෙකකි.

1). මුදලේ සංසරණ ප්‍රවේගය (V) ස්ථාවර බව

2) ආර්ථිකයේ මූර්ත නිමැවුම් පරිමාව (Y) නොවෙනස්ව පවතී. නැතහොත් ආර්ථිකය පූර්ණ සේවා නියුක්ති මට්ටමේ පවතී.

මෙලෙස විනිමය සමීකරණයේ V සහ Y පද ස්ථාවරව පවතින්නේ නම් M හා P අතර සමානුපාතික සම්බන්ධතාවක් හට ගනී. **(ලකුණු 2)**

(මුළු ලකුණු 04)

---

07). **i. මුදල් මුදල් ලෙස ළඟ තබා ගැනීමෙන් මිනිසුන්ට කිසිදු ආදායමක් නොලැබේ. එසේ නම් මිනිසුන් මුදල් ළඟ තබා ගන්නේ ඇයි?** **(ලකුණු 3)**

ii. වාණිජ බැංකුවල තැන්පතු මැවීම පිළිබඳ පවතින සීමා මොනවාද? **(ලකුණු 3)**

iii. වාණිජ බැංකු පද්ධතියක සරල ශේෂ පත්‍රයක් පහත දැක්වේ.

වගකීම්		වත්කම්	
ඉල්ලුම් තැන්පතු	400	සංචිත	80
		ණය	320
	400		400

මහජනයා සතු ව්‍යවහාර මුදල් මිලියන 480 ක් සහ බැංකු පද්ධතියේ මිලියන 40 ක අධි සංචිත පවතින බව සලකන්න.

අ) තැන්පතු ගුණකයේ අගය කොපමණද? **(ලකුණු 2)**

ආ) ණය මැවීම සම්පූර්ණ කළ විට මුදල් සැපයුම කොපමණද? **(ලකුණු 2)**

ඇ) සංචිත අනුපාතය 25% ක් වූ විටක ණය මැවීම සම්පූර්ණ කළ විට මුදල් සැපයුම කොපමණ වේද? **(ලකුණු 2)**

iv. වාණිජ බැංකුවල අධි ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමට මහ බැංකුව අනුගමනය කරන ක්‍රම මොනවාද? **(ලකුණු 2)**

v. රටක මුදල් සැපයුම අඩු කිරීම සඳහා මහ බැංකුව අනුගමනය කරන ක්‍රම මොනවාදැයි පැහැදිලි කරන්න. **(ලකුණු 6)**

---

i. - ගණුදෙනු චේතනාව - ආරක්ෂණ චේතනාව - සමපේක්ෂණ චේචනනාව **(ලකුණු 3)**

ii. - මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති - වාණිජ බැංකුවල අධිසංචිත පවත්වාගෙන යාම
- ණය සඳහා පවතින ඉල්ලුම අඩු වීම - මහජනයා මුදල් ලඟ තබා ගැනීමට දක්වන කැමැත්ත
(කරුණු 3 ක් සඳහා ලකුණු 3)

iii. **අ)** සංචිත අනුපාතය

$$\frac{40}{400} \text{ x } 100 = 10\%$$

$$K = \frac{1}{R} = \frac{1}{10/100} = 1 \text{ x } \frac{100}{10} = \underline{10}$$ **(ලකුණු 2)**

ආ) M_1 = ව්‍යවහාර මුදල් + බැංකු මුදල්
= 480 + 80 x 10
= 480 + 800
= 1280 **(ලකුණු 2)**

ඇ) M_1 = ව්‍යවහාර මුදල් + බැංකු මුදල්
= 480 + 80 x 4
= 480 + 320
= 800 **(ලකුණු 2)**

iv. - දෛනික විවට වෙළඳ කටයුතු යටතේ සුරැකුම්පත් විකිණීම
- නිත්‍ය තැන්පතු පහසුකම් හඳුන්වා දීම
- කාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි පැවැත්වීම **(ලකුණු 2)**

v. - සංචිත අවශ්‍යතා වැඩිකිරීම
- භාණ්ඩාගාර බිල්පත් විකිණීම
- පොලී අනුපාත ඉහළ දැමීම

- සංචිත අවශ්‍යතා ඉහළ දැමීම - මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ දැමූ විට වාණිජ බැංකුවල අධි සංචිත අඩුවේ. එවිට ණය දීමේ හැකියාව අඩුවේ. ණය මැවීම අඩුවේ. රටේ සමස්ථ මුදල් සැපයුම අඩුවේ.
- භාණ්ඩාගාර බිල්පත් විකිණීම - මහ බැංකුව විසින් විවෘත වෙළඳපොලේ භාණ්ඩාගාර බිල්පත් අලෙවිකලවිට වාණිජ බැංකු ඒවා මිලට ගනී. එවිට වාණිජ බැංකුවල අධිසංචිත අඩුවේ. එවිට වාණිජ බැංකුවලට ණයදීමේ හැකියාව අඩුවී ණය මැවීම අඩුවී රටේ මුදල් සැපයුම අඩුවේ.
- පොලී අනුපාත ඉහළ දැමීම - මහ බැංකුව විසින් පොලී අනුපාතය ඉහළ දැමූවිට වාණිජ බැංකු ද තම ණය සඳහා පොලී අනුපාත ඉහළ දමයි. එවිට ණය ගැනීමේ ආවස්ථික පිරිවැය වැඩි බැවින් ණය ගැනීම් අඩුවේ. එවිට ණය මැවීම අඩු වී රටේ මුදල් සැපයුම අඩුවේ. **(ලකුණු 6)**

---

08). i. වෙළඳපොල ආර්ථිකයකට රජය මැදිහත් වීම සාධාරණීකරණය කළ හැකි වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

ii. පරිභෝජනයේ ධන බාහිරතා පවතින විට වෙළඳපොල ක්‍රමය අසාර්ථක වන ආකාරය රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

iii. රජයේ බදු නොවන ආදායම් මාර්ග මොනවාද? **(ලකුණු 4)**

iv. 2016 රජයේ වර්තන වියදම් සංයුතිය පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

v. රාජ්‍ය අයවැයේ ප්‍රාථමික හිඟය හා ශුද්ධ මූල්‍ය හිඟය අතර වෙනස පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

---

i. වෙළඳපොල ආර්ථිකයකට රජය මැදිහත් වීම සාධාරණීකරණය කල හැකිවන්නේ වෙළෙඳපොල ආර්ථිකයේ විවිධ දුර්වලතා සහ අකාර්යක්ෂමතා පැවතීම හේතුවෙනි.

උදා - පොදු භාණ්ඩ නොසැපයීම
- ශුභ සාධන භාණ්ඩ ප්‍රමාණවත් ලෙස නොසැපයීම
- බාහිරතා සැලකිලිමත් නොවීම.
- සාධාරණත්වයක් නොමැතිවීම
- සාර්ව ආර්ථික අසමතුලිතතාවය
- යටිතල පහසුකම් නොසැපයීම
- ඌණ නිෂ්පාදන අධි නිෂ්පාදන පැවතීම **කරුණු 03 ක් සඳහා ලකුණු 4)**

ii.



(රූප සටහනට ලකුණු 2)

B = සමාජ වශයෙන් ප්‍රශස්ත නිමැවුම

A = වෙළඳපොල ප්‍රශස්ත නිමවුම

පරිභෝජනයේ ධන බාහිරතා පවතින විට සමාජීය ප්‍රශස්ත පරිභෝජන වෙළඳපොල ප්‍රශස්ත පරිභෝජනය ඉක්මවා යන අතර රටතුල ඌණ නිෂ්පාදනයක් හටගනී. එබැවින් වෙළඳපොල අසමත්වීම් ඇතිවේ.

(පැහැදිලි කිරීමට ලකුණු 2)

iii.
- ලාභ හා ලාභාංශ
- දේපල ආදායම්
- රාජ්‍ය ව්‍යවසාය දළ ලැබීම්
- පොලී ආදායම
- විකුණුම් ආදායම්
- ගාස්තු හා අයකිරීම්
- දඩ මුදල්

(කරුණු 4 කට ලකුණු 4)

iv.

	ද.දේ.නි. ප්‍රතිශතය	වර්තන වියදමේ ප්‍රතිශතය
භාණ්ඩ හා සේවා විකුණුම්	6.3 %	42%
රාජ්‍ය ණය පොලී	5.2%	35%
වර්තන පැවරුම්	3.4%	23%

(නම් කිරීමට ලකුණු 2)

2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ රජයේ වර්තන වියදම් සංයුතිය දෙස බලන විට භාණ්ඩ හා සේවා සඳහා විකුණුම් 42% පමණ වී ඇති අතර සංක්‍රාම විකුණුම් 58% ක් පමණ වී තිබේ. වර්තන වියදමේ ඇතුලත් වියදම් වල භාණ්ඩ හා සේවා වියදමේ රාජ්‍ය සේවක වැටුප් ගෙවීම් ඉහළ අගයක් ගෙන තිබේ.

(පැහැදිලි කිරීම එක් කරුණකට ලකුණු 2)

v.
- රජ්‍ය අයවැයේ ප්‍රාථමික හිඟය යනු සමස්ත අයවැය හිඟයෙන් රාජ්‍ය ණය පොලී අඩුකල විට ලැබනෙ ඍණ අගයයි. ණය පොලී නොමැතිව ගණනය කරන ලද සමස්ත ශේෂය ප්‍රාථමික ශේෂය වේ. එය ඍණ අගයක් ගන්නේ නම් ප්‍රාථමික හිඟයක් ලෙස හැඳින්විය හැකිය.
- රාජ්‍ය අයවැයේ ශුද්ධ මූල්‍ය හිඟය ලෙස හඳුන්වන්නේ සමස්ත අයවැය හිඟයෙන් ණය වාරික ගෙවීම්, නිදන් අරමුදලට කරන ගෙවීම්, ජාත්‍යන්තර සංවිධානවලට ගෙවිය යුතු මුදල් අඩුකළ පසු ලැබෙන ඍණ ශේෂයයි.

(ලකුණු 2)

---

09). i. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය යනුවෙන් කුමක් අදහස්වේද? (ලකුණු 2)

ii. ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා වැඩපිලිවෙලේ ඉලක්කයන් මොනවාද? (ලකුණු 3)

iii. 2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවය සඳහා හේතු වූ සාධක මොනවාද? (ලකුණු 3)

iv. විදේශ වෙළදාමේ සාපේක්ෂ වාසිය හා නිරපේක්ෂ වාසිය අතර වෙනස පැහැදිලි කරන්න (ලකුණු 6)

v. නිදහස් විදේශ වෙළඳ කටයුතු වලට සම්බන්ධ වීමෙන් නොදියුණු රටවලට මුහුණ පෑමට සිදුවන අවාසි වලින් මිදීම සඳහා අනුගමනය කළ හැකි බදු නොවන ආරක්ෂක ක්‍රම නම් කරන්න. (ලකුණු 6)

---

i. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය යනු රජයේ අයවැය හිඟය අවම කිරීම සහ ණය ඒකරාශීවීම අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති වේ. **(ලකුණු 2)**

ii.
- බදු පදනම ප්‍රසාරණය කිරීම
- බදු පැහැර හැරීම හා මග හැරීම අවම කිරීම
- බදු දීමනා තාර්කීකරණය කිරීම
- බදු පරිපාලනය වැඩි දියුණු කිරීම
- බදු අනුපාත සංශෝධනය කිරීම

(කරුණු 3 කට ලකුණු 3)

iii.
- දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම පහළ මට්ටමක පැවතීම
- ශ්‍රී ලංකාව 14.2%
- රාජ්‍ය ඉතුරුම් ඍණ අගයක් ගැනීම
- බදු පදනම පිරිහීම
- ආසියාව 26.6%
- 0.6 %
- බදු රැස්කිරීම දුර්වල මට්ටමක පැවතීම

(කරුණු 3 කට ලකුණු 3)

iv. - සාපේක්ෂ වාසිය යනු සමාන සම්පත් ප්‍රමාණයක් යොදාගනිමින් එක් ආර්ථික ඒකකයකට තවත් ආර්ථික ඒකකයකට වඩා අඩු ආවස්ථික පිරිවැයක් යටතේ භාණ්ඩයක් නිෂ්පාදනය කොට අපනයනය කිරීමට හැකිවන තත්ත්වයකි.

- නිරපේක්ෂ වාසිය යනු සමාන සම්පත් ප්‍රමාණයක් යොදා ගනිමින් එක් ආර්ථික ඒකකයකට තවත් ආර්ථික ඒකකයකට වඩා අඩු පිරිවැයක් යටතේ යම් භාණ්ඩයක් නිෂ්පාදනය කොට අපනයනය කිරීමට හැකිවන තත්ත්වයකි.
- සාපේක්ෂ වාසිය අඩු ආවස්ථික පිරිවැය අනුව සලකා බලන අතර නිරපේක්ෂ වාසිය අඩු පිරිවැය යටතේ සලකා බලයි. **(ලකුණු 6)**

v. - සලාක ක්‍රමය (කෝටා) - විනිමය පාලනය
- ආනයන තහංචි පැනවීම - ආනයන බලපත්‍ර ක්‍රමය
- වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම - නිෂ්පාදන ප්‍රමිතීන් නියම කිරීම
- කාටල් පිහිටුවීම **(කරුණු 6 කට ලකුණු 6)**

---

10). **i. අන්තර් ජාතික වෙළඳාමේ මූලාශ්‍ර දක්වන්න** **(ලකුණු 4)**

ii. කිසියම් රටක් විදේශ වෙළඳාමට සම්බන්ධ වීමෙන් අත්කරගත හැකි වාසි මොනවාද? **(ලකුණු 4)**

iii. පහත දැක්වෙන්නේ ඇමරිකා එක්සත් ජනපදය හා එක්සත් රාජධානිය පරිගණක හා මෝටර් රථ සම්බන්දයෙන් සම්පත් ඒකකයක නිමැවුම් ප්‍රමාණයන්ය.

	ඇ.එ.ජ.	එක්සත් රාජධානිය
පරිගණක	2	10
මෝටර් රථ	5	6

(අ) භාණ්ඩ දෙක සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසි ඇති රට නම් කර හේතු දක්වන්න **(ලකුණු 2)**

(ආ) භාණ්ඩ දෙක සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි ඇති රට හේතු සහිතව පෙන්වා දෙන්න **(ලකුණු 6)**

iv. සාපේක්ෂ වාසි න්‍යායට පදනම් කර ගන්නා උපකල්පන මොනවාද? **(ලකුණු 4)**

---

i. - තාක්ෂණයේ වෙනස්කම් හා නව්‍යතා - සාධක සම්භාරය වෙනස්වීම
- නිෂ්පාදනයේ පරිමාණානුකූල පිරිමැසුම් දක්නට ලැබීම - අභිරුචියේ පවත්නා වෙනස්කම්
- විශේෂ ප්‍රාගුණ්‍යය - ආරම්භක තත්වය
- රටවල ස්ථානගතවීම - රාජ්‍ය ප්‍රතිපත්ති
- වෙළඳපොල ව්‍යුහය **(කරුණු 4 කට ලකුණු 4)**

ii. - වෙළෙඳපොල පුළුල් වීම
- රටතුළ නිදවන භාණ්ඩ අතිරික්තය අපනයනය කළ හැකි වීම.
- රටතුළ නිෂ්පාදනය කිරීමට නොහැකි භාණ්ඩ ආනයනය කළ හැකි වීම.
- තාක්ෂණික දැනුම හුවමාරු කරගත හැකිවීම
- දේශීය වශයෙන් ඉහළ නිෂ්පාදන පිරිවැයක් සහිත භාණ්ඩ අඩු පිරිවැයක් යටතේ ආනයනය කළ හැකිවීම.
- මහා පරිමාණ නිෂ්පාදනයට ඉඩ සැලසීම
- විශේෂීකරණයේ හා හුවමාරුවේ ප්‍රතිලාභ අත්කරගත හැකිවීම.
- දේශීය සුභසාධන මට්ටම ඉහළ යාම. **(කරුණු 4 ට ලකුණු 4)**

iii (අ) භාණ්ඩ දෙක සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසි ඇත්තේ එක්සත් රාජධානියටයි. එයට හේතුව ඇමරිකා එක්සත් ජනපදයට වඩා වැඩි කාර්යක්ෂමතාවයකින් භාණ්ඩ දෙකම නිෂ්පාදනය කිරීමට එක්සත් රාජධානියට හැකිවීම **(ලකුණු 2)**

(ආ) ඇමරිකා එක්සත් ජනපදය

පරිගණකයක ආවස්ථික පිරිවැය = $^{5}/_{2}$ = <u>2.5</u>

මෝටර් රථයක ආවස්ථික පිරිවැය = $^{2}/_{5}$ = <u>0.4</u> **(ලකුණු 1)**

එක්සත් රාජධානයි

පරිගණකයක ආවස්ථික පිරිවැය = $^{6}/_{10}$ = <u>0.6</u>

මෝටර් රථයක ආවස්ථික පිරිවැය = $^{10}/_{6}$ = <u>1.6</u> **(ලකුණු 1)**

- ඇමරිකාවට වඩා අඩු ආවස්ථික පිරිවැයකින් පරිගණක නිපදවීමට එක්සත් රාජධානියට හැකිවන නිසා පරිගණක නිෂ්පාදනය සම්බන්ධ සාපේක්ෂ වාසි එක්සත් රාජධානියට හිමිවේ. **(ලකුණු 2)**
- එක්සත් රාජධානියට වඩා අඩු ආවස්ථික පිරිවැයකින් මෝටර් රථ නිෂ්පාදනය කිරීමට ඇමරිකාවට හැකිවන නිසා මෝටර් රථ නිෂ්පාදනය සම්බනධියෙන් සාපේක්ෂ වාසිය ඇ.එ.ජනපදයට හිමිවේ. **(ලකුණු 2)**

iv. - රටවල් දෙකක් හා භාණ්ඩ දෙකක් පමණක් සැලකිල්ලට ගැනීම
- ශ්‍රම සම්පත් පමණක් පවතින බව - රටවල් දෙකේම සම්පත් සම්භාරය සමාන බව
- රටවල් දෙක අතර ශ්‍රම සංචලනයක් නොමැති බව - රටවල් දෙකේම ස්ථාවර පරිමාණානුකූල ඵල පවතින බව.
- ප්‍රවාහන පිරිවැයක් නොමැති බව **(ඕනෑම කරුණු 4 ලකුණු 4)**